# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

අංක 56 — 1973 අප්‍රේල් 19 වැනි බ්‍රහස්පතින්ද — 1973.04.19

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (II අ) වැනි ඡේදය—පළකිරීම්

(වෙන වෙනම ගොනුකරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිට | | පිට |
|---|---|---|---|
| තනතුරු—ඇබෑර්තු ... ... ... | 491 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 503 |


සැලකිය යුතුයි.—ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 15 දරන ශ්‍රී ලංකා ජාතික සාහිත්‍ය කිරීමේ ව්‍යාපාර පනත 1973 අප්‍රේල් මස 19 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළවේ.

## තනතුරු—ඇබෑර්තු

### ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කෙරෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාළවන පොදු කොන්දේසි

දීමනා.—පෞද්ගලික දීමනාව, තාවකාලික ජීවන දීමනාව, තාවකාලික විශේෂ දීමනාව යන මෙම දීමනා ඒ සම්බන්ධයෙන් අභ්‍යන්තරයෙන් සඳහන් කොට නැති අවස්ථාවන්හිදී ආණ්ඩුවේ රෙගුලාසි අනුව ගෙවනු ලැබේ.

2. සේවා කොන්දේසි.—පත්වීම් ලබන රාජ්‍ය සේවා කොමිෂන් සභා ව්‍යවස්ථා මුදල් රෙගුලාසි, කාර්ය සංවිධාන සංග්‍රහය රෙගුලාසි, දෙපාර්තමේන්තු විධාන හෝ රෙගුලාසි සහ මේවාට සහ ආණ්ඩුවෙන් කලින් කල නිකුත් කෙරෙන සෙසු විධිවිධානවලට හෝ රෙගුලාසිවලට යටත් වන්නේය.

3. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි.—(i) විශ්‍රාම වැටුප් රහිත සංස්ථාවලට කරන පත් කිරීම්වල දී (දවස් පඩි ලබන්නන් හැර) ඒ තනතුරුවලට පත්වන්නන්ට තම පඩියෙන් සියයට 5 ක් රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදලට ගෙවීමට නියම කරනු ලැබේ. මීට අතිරේක වශයෙන් ස්වකීය මනාපය පරිදි තවත් සියයට 5 ක් එක් කිරීමට ඔවුන්ට ඉඩ දෙනු ලැබේ. නිලධාරියා මේ දෙකෙන් කවරක් ගෙවුවත් එක් එක් මුදල් අවුරුද්ද අවසානයේ දී ඔහුට ගෙවා ඇති සම්පූර්ණ වැටුපෙන් සියයට 7 1/2 කට සමාන මුදලක් අරමුදලට සම්මාදම් වශයෙන් ආණ්ඩුවෙන් ද ගෙවනු ලැබේ.

(ii) ඒ ඒ තනතුරුවලට පත් වන්නන් විසින් "ඇප තැබිය යුතුය" යි ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් තීරණය කරනු ලැබුවහොත් එවිට ආණ්ඩුවේ නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත අනුකූලව ඇප තබන ලෙස ඔවුන්ට නියම කෙරෙනු ඇත.

(iii) තනතුරුවලට පත්වන්නන් අතුරෙන් දැනටමත් රාජ්‍ය සේවා වෙහි සිටින්නන් හැර සෙසු සැමට ලංකාවේ කවර පෙදෙසක වුවත් සේවය කිරීමට ඔවුන් සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම සඳහා ආණ්ඩුවේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණය කට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

4. රාජ්‍ය සේවයට බැඳෙන නව ප්‍රවේශකයෝ.—(i) යම් තනතුරක් සඳහා වඩා දීර්ඝ කාලයක් නියම කොට ඇත්නම් මිස, අදාළවන පරිදි විශ්‍රාම වැටුප් සහිත/විශ්‍රාම වැටුප් රහිත තනතුරුවලට පත් කරන ලද නව ප්‍රවේශක නිලධාරීන්ගේ ආධුනික/පරීක්ෂා සේවා කාල පරිච්ඡේදය අවුරුදු තුනක් විය යුතුය.

(ii) සියළුම නව ප්‍රවේශක නිලධාරීන් 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනතේ විධිවිධානවලටත්, රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනටමත් පනවා ඇති සියළුම නීතිරීති හා ව්‍යවස්ථාවලටත් මතුවට පනවනු ලබන නීතිරීති හා ව්‍යවස්ථාවලටත් අනුකූලව ක්‍රියා කළ යුතුය යන කොන්දේසිය පිළිගත යුතුය.

---

සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ

**විශේෂ නිවේදනයයි**

ශ්‍රී ලංකා ජනරජයේ සතිපතා පළවන ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II අ) සහ (II ආ) වැනි ඡේදයෙහි පළවිය යුතු දැන්වීම් ගැසට් පත්‍රය පළවන සතියට පෙර සතියේ බදාදා දවල් 12.00 ට පෙර රජයේ මුද්‍රණාලයට ලැබිය යුතුයි. ප්‍රමාදවී ලැබෙන දැන්වීම් කුමන හේතුවක් නිසාවත් බාරගනු නොලැබේ.

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1972 දෙසැම්බර් මස 15 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ.

---


491—බී 70867 — 16,315 (73/4)

B 1 අ

(iii) මෑතකදී ලබාගත් චරිත සහතික තුනක් (රාජ්‍ය සේවාවෙහි සිටින ඉල්ලුම්කරුවන් ගෙන් මේවා බලාපොරොත්තු නොවේ).

සැ. යු.—ඉහත සඳහන් සහතික පිටපත් ආපසු එවනු නොලැබේ.

6. ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ හා සම්බන්ධ ලියමනක් තැපෑලේ දී නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බලනු නොලැබේ. අවසාන දින කීපය දක්වා ඉල්ලුම් පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි යම් අවාසියක් වෙතොත් එය අයදුම්කරුවන් විසින් ම විඳ දරාගත යුතු වේ. ආණ්ඩුවේ හා සංස්ථා සේවයෙහි නියුක්ත නිලධාරීන් එවන අයදුම් පත් නියමිත දිනයෙන් පසුව මෙහි ලැබුණහොත්, ඒ අයදුම් පත් බාරගනු ලබන්නේ ඒවා නියමිත දිනයට කලින් දෙපාර්තමේන්තුවේ හෝ සංස්ථාවේ ප්‍රධානයාට ලැබී තිබුණහොත් ද, ඒවා ප්‍රමාද වීමට සෑහෙන හේතු දක්වමින් එම අයදුම් පත් බාර ගන්නා ලෙස දෙපාර්තමේන්තුවේ හෝ සංස්ථාවේ ප්‍රධානියා නිර්දේශ කරතොත් ද පමණකි.

7. අයදුම් පත් හා ඒ පිළිබඳ සෙසු ලියුම් කියුම් එවිය යුත්තේ රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ යම්කිසි නිලධාරියෙකුගේ පෞද්ගලික නමට නොව, "රාජ්‍ය භාෂා කටයුතු පිළිබඳ කොමසාරිස්, තැ. පෙ. 598, 22, ඊඩ් මාවත, කොළඹ 7" යන ලිපිනයටය.

8. එවන සෑම අයදුම් පතක් ම ලැබුණු බව දන්වා එවනු ලැබේ. අයදුම් පත් බාර ගන්නා අවසාන දිනයේ සිට සතියක් ඇතුළත එවැනි දැන්වීමක් යම් අයදුම්කරුවකුට නොලැබුණහොත්, ඔහු විසින් ඒ බව රාජ්‍ය භාෂා කටයුතු පිළිබඳ කොමසාරිස්ට වහාම දන්වා එවිය යුතුය. එසේ නොකරන අයගේ හිමිකම් ගැන සලකා බලනු නොලැබේ.

9. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ II වැනි ඡේදයේ ආරම්භයෙහි සඳහන් වන්නා වූ ද රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්වීම් සම්බන්ධයෙන් අදාළ වන්නා වූ ද පොදු කොන්දේසි කෙරෙහි අවධානය යොමු කරවනු ලැබේ.

පීටර් පී. අබේසේකර,
රාජ්‍ය භාෂා කටයුතු පිළිබඳ කොමසාරිස්.

රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව,
22, ඊඩ් මාවත,
කොළඹ 7,
1973. 04. 07 වැනි දිනදීය.

### රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව

### භාෂා පරිවර්තක (ඉලක්ක භාෂාව—සිංහල) තනතුර සඳහා ඉල්ලුම් පත්‍ර ආකෘතිය

(සැ. යු.—ඉල්ලුම් පත්‍රය බහාලන ලියුම් කවරයේ වම්පස ඉහළින් කෙළවරේ "භාෂා පරිවර්තක (ඉලක්ක භාෂාව—සිංහල) තනතුර සඳහා ඉල්ලුම් පත්‍රය" යන පාඨය ලියා එය ලියාපදිංචි තැපෑලෙන් රාජ්‍ය භාෂා කටයුතු පිළිබඳ කොමසාරිස් වෙත එවිය යුතුය.)

(1) සම්පූර්ණ නම :————.

(2) ලිපිනය :————.

(3) උපන් දිනය හා උපන් ස්ථානය :————.
(උප්පැන්න සහතිකයේ පිටපත් ඇමිණිය යුතුය)

1973 මැයි මස 10 වැනි දිනට වයස——
අවුරුදු—— මාස :——, දින :——.

(4) ජාතිය :————.

(5) විවාහකද, අවිවාහක ද යන බව :————.

(6) (අ) අධ්‍යාපන සහ/හෝ ශිල්පීය සුදුසුකම් :————.
(සහතිකවල පිටපත් ඇමිණිය යුතුයි.)

(ආ) සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා විෂයයන් වශයෙන් ඇතිව සමාර්ථය ලත් උසස් ම විභාගය :————.

සිංහල :————.

දෙමළ :————.

ඉංග්‍රීසි :————.

(ඇ) පරිවර්තන වැඩ සම්බන්ධයෙන් පළපුරුදුකම් තිබේ නම් විස්තර සඳහන් කරන්න :————.

(ඈ) සාහිත්‍ය කෘතීන් කර පළපුරුදුකම් තිබේ නම්, ඒවාද සඳහන් කරන්න :————.

(7) (අ) පාඨශාලාවෙන් අස්වූ පසු කළ රැකියා සහ/හෝ හැදෑරූ අභ්‍යාස පිළිබඳ විස්තර :————.

(ආ) රජයේ සේවයේ යෙදී සිටී නම්, දැනට දරණ තනතුර හා ලබන වාර්ෂික වැටුප සඳහන් කරන්න :————.

(8) මීට කලින් ආණ්ඩුවේ යම්කිසි දෙපාර්තමේන්තුවක හෝ රාජ්‍ය සංස්ථාවල සේවය කළේ නම් එයින් අස්වීමට හේතුව සඳහන් කරන්න :————.

(9) යම්කිසි සාපරාධී වරදකට කෙදිනක හෝ උසාවියකදී වැරදිකරු වී ඇත්නම්, එම වරද හා ලැබූ දඬුවම පිළිබඳ විස්තර සඳහන් කරන්න :————.

(10) චරිත සහතික දී ඇති පුද්ගලයන් තිදෙනාගේ නම් සහ පදවි නාම:—

(1) ————.
(2) ————.
(3) ————.

————
අත්සන.

දිනය :————.

4-477—73.04.19 දින අංක 56 දරණ ගැසට් පත්‍රය

---

### මිල පාලන දෙපාර්තමේන්තුව

### II වන පන්තියේ කිරුම් හා මිනුම් යාන්ත්‍රික තනතුර

මෙම දෙපාර්තමේන්තුවේ කිරුම් හා මිණුම් අංශයේ II වන පන්තියේ කිරුම් හා මිණුම් යාන්ත්‍රික තනතුරක් සඳහා ඉල්ලුම් පත් කැඳවනු ලැබේ. මෙහි පහත දක්වා ඇති ආකෘති පත්‍රය අනුව සකස් කරන ලද අයදුම්පත් මිල පාලක හා සම්මත ප්‍රමාණ භාරකරු, කිරුම් හා මිණුම් අංශය, මිල පාලන දෙපාර්තමේන්තුව, උද්‍යාන පාර, කොළඹ 5, යන ලිපිනයට 1973 මැයි 15 දිනට හෝ ඊට ප්‍රථමයෙන් ලැබෙන සේ එවිය යුතුය.

සැලකිය යුතුයි : ඉල්ලුම්පත් බහා එවන ලියුම් කවරයේ වම් කෙළවරේ "II වන පන්තියේ කිරුම් හා මිණුම් යාන්ත්‍රික තනතුර සඳහා අයදුම්පත" යනුවෙන් සඳහන් කළ යුතුය. අයදුම්පත ලැබුණු බව දන්වනු නොලැබේ.

2. (1) සේවා කොන්දේසි.—මෙම තනතුර ස්ථිරය. ආධුනික සේවා කාලය අවුරුදු 3 කි. තෝරාගත් අයදුම්කරු රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.

3. (1) වැටුප් ක්‍රමය.—මෙම තනතුර සඳහා නියමිත කල්පිත වැටුප් ක්‍රමය—පළමුවන හය මාසය තුළ දිනකට රු. 2.30 බැගින් සහ ඊට පසු වර්ෂයකට රු. 750—42×13—රු. 1,296.

ඒකාබද්ධ වැටුප් ක්‍රමය—පළමුවන 6 මාසය තුළ දිනකට රු. 8 බැගින් හා ඊටපසු වර්ෂයකට රු. 2,640—15×60—රු. 3,540.

4. අවශ්‍ය සුදුසුකම් :

(i) මනා චරිතගුණයකින් යුක්ත විය යුතුය.

(ii) 1973 මැයි 15 දිනට වයස අවුරුදු 21 ට නොඅඩු හා අවුරුදු 30 ට නොවැඩි අය විය යුතුය. (දැනටමත් රජයේ සේවයේ යෙදී සිටින්නන්ට උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.)

(iii) යටත් පිරිසෙයින් 6 වන පන්තියෙන් සමත් වී සිටිය යුතුය.

(iv) යථා තත්ත්ව වැඩ වල යෙනුනු වැද්දුම් කරුවෙකු වශයෙන් හෝ කිරුම් හා මිනුම් උපකරණ අලුත්වැඩියා කරුවෙකු වශයෙන් හෝ යටත් පිරිසෙයින් අවුරුදු 3 ක් වත් පළපුරුද්දක් තිබිය යුතුය.

(v) සරල රූප සටහන් කියවා තේරුම් ගැනීමට සමත් විය යුතුය.

(vi) පිළිගත් ආයතනයක II පන්තියේ අදාල තනතුරක යටත් පිරිසෙයින් අවුරුදු 5 ක පළපුරුද්දක් තිබිය යුතුය.

සටහන : එක්සත් රාජධානියේ කඳවුරු වල කළ සේවය පිළිගත් ආයතනයක කළ සේවය වශයෙන් පිළිගනු ලැබේ.

5. අයදුම්කරුවන් තමන්ගේ අයදුම්පතට පහත සඳහන් කරන සහතික පත් වල පිටපත් අමුණා එවිය යුතුය. (මුල් පිටපත් නොවේ.)

(i) උප්පැන්න සහතිකය.

(ii) 4 වන ඡේදයෙන් අපේක්ෂිත සුදුසුකම් තමා සතු බවට ලේඛන ගත සාක්ෂි.

(iii) මෑතකදී ලබා ගත් චරිත සහතික පත් දෙකක්.

6. රජයේ සේවයේ හෝ සංයුක්ත මණ්ඩලවල සේවයේ නියුක්ත නිලධාරීන් විසින් තමන්ගේ ඉල්ලුම්පත්‍ර ස්වකීය දෙපාර්තමේන්තු හෝ සංයුක්ත මණ්ඩල වල ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ

යුතුය. අයදුම්කරුවන් තෝරා ගතහොත් ඒ සඳහා දැනට නිරත සේවයෙන් මුදා හැරීමට හැකි බවට දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ සංයුක්ත මණ්ඩල ප්‍රධානියා ගේ සහතිකයක් ද ඉදිරිපත් කළ යුතුය.

7. මෙම ගැසට් පත්‍රයේ I වන කොටස (IIඅ) වන ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවාවේ තනතුරු වලට අදාල පොදු කොන්දේසි කෙරෙහි අයදුම්කරුවන්ගේ අවධානය යොමු කරවනු ලැබේ.

අසිවත් සමරවික්‍රම,
මිල පාලක.

1973 අප්‍රේල් 4 දින,
කොළඹ.

ආදර්ශ අයදුම්පත

II වන පන්තියේ කිරුම් හා මිණුම් යාන්ත්‍රික තනතුර සඳහා අයදුම්පත

1. සම්පූර්ණ නම :————.

2. ලිපිනය :————.

3. උපන් දිනය :————.

4. 1973 මැයි 15 වන දිනට වයස :————.
(උප්පැන්න සහතික පිටපතක් අමුණා එවිය යුතුය.)

5. (අ) පුරවැසි භාවය පරම්පරාවෙන් ද නැතහොත් ලියාපදිංචි වීමෙන් ද ? :————.

(ආ) පුරවැසි භාවය ලියාපදිංචි වීමෙන් නම් එම ලියාපදිංචිවීම පිළිබඳ විස්තර :————.

6. අයදුම්කරුගේ අධ්‍යාපනික සුදුසුකම් :————.

7. (අ) පළපුරුදුකම් පිළිබඳ විස්තර :————.

(ආ) වෙනත් සුදුසුකම් :————.

8. පාසලෙන් අස්වූ පසු රැකියාවන්හි යෙදුනේ නම් ඒවාට ඇතුල් වූ දිනයන් හා අස්වූ දිනයන් ද රජයේ සේවයේ යෙදුනේ නම් ඒ පිළිබඳ සම්පූර්ණ විස්තරයක් සඳහන් කරන්න.

9. සිංහල හා/හෝ දෙමළෙන් ලිවීමට හෝ කියවීමට හෝ කථා කිරීමට ඇති හැකියාවන් පිළිබඳ සම්පූර්ණ විස්තර:————

10. අයදුම්කරුගේ පළපුරුදුකම් ආදිය ගැන විමසා තොරතුරු ලබා ගැනීමට හැකි පුද්ගලයන් දෙදෙනෙකුගේ නම්, තනතුරු හා ලිපිනයන් :————.

මෙම අයදුම්පතේ දක්වා ඇති තොරතුරු සත්‍ය බවත් නිවැරදි බවත් මම සහතික කරමි. තෝරා ගැනීමට පෙරාතුව දක්වා ඇති විස්තර අසත්‍ය බැව් හෝ සාවද්‍ය බව හෝ පෙනී ගියහොත් මා මෙයට නුසුදුසු වීමට හේතු වන බව දන්නා අතරම පත්වීම ලැබුනාට පසු ඒ බව සොයා දැන ගතහොත් කිසිදු වන්දියක් නොලබා සේව යෙන් පහකිරීමට හේතු වන බව දනිමි.

————.
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

4–460—73.04.19 දින අංක 56 දරණ ගැසට් පත්‍රය

---

කම්කරු දෙපාර්තමේන්තුව

ගොඩනැගිලි ඕවර්සියර් තනතුරු

කම්කරු දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි ඕවර්සියර් තනතුරු සඳහා අයදුම් පත් කැඳවනු ලැබේ. පහත දක්වා ඇති ආදර්ශ අයදුම් පත්‍රය අනුව පිළියෙල කළ අයදුම් පත්‍ර 1973 මැයි 05 දින හෝ ඊට පෙර කොළඹ 5, කම්කරු මහාලේකම් කාර්යාලයේ කම්කරු කොම සාරිස් වෙත ලැබෙන සේ ලියා පදිංචි කළ තැපෑලෙන් එවිය යුතුයි.

2. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි.—මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් රහිතය. රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය. එහෙත් තෝරා ගනු ලබන අපේක්ෂකයා පත්වීම ලබන දින රාජ්‍ය සේවයේ ස්ථිර වැටුප් සහිත තනතුරක් දරන්නකු වුවහොත්, තවදුරටත් එම විශ්‍රාම වැටුප් අයිතිය ඔහු භුක්ති විඳිනු ඇත.

3. වැටුප්.—වර්ෂයකට රු. 3,60 න් ආරම්භව රු. 60 බැගින් වාර්ෂික වැඩිවීම් 9 කින් රු. 3,600 දක්වා නැගෙන ඒකාබද්ධ වැටුප් ක්‍රමයක් මෙම තනතුරට අදාල වේ. (සටහන : 1969.10.01 දිනට පෙර පැවති කල්පිත මූලික වැටුප් ක්‍රමය වර්ෂයකට රු. 1,044—42×8—1,380 කි.)

4. අවශ්‍ය සුදුසුකම්: —

(අ) විශිෂ්ඨ චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යයෙන් යුක්ත විය යුතුය. 1973 මැයි 05 වැනි දිනට අවුරුදු 21 ට නොඅඩු අවුරුදු 35 ට නොවැඩි විය යුතුය. (දැනටමත් රජයේ සේවයේ සිටින නිලධාරීන්ට මෙම වයස් සීමාව බල පවත්වනු නොලැබේ.)

(ආ) (i) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ

(ii) දෙකකට නොවැඩි වාර ගණනකදී අංක ගණිතය/හෝ ශුද්ධ ගණිතය හෝ/මූලික ගණිතය සහ සිංහල/දෙමළ භාෂාව ඇතුළුව විෂයයන් 6 කින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් සමත්වීම සහ

(ඇ) කනිෂ්ඨ කාර්මික ආයතනයක ගොඩනැගිලි නිර්මානය—සන්ධ්‍යා තුන් අවුරුදු පාඨමාලාව සමත් වී සිටිය යුතුය.

නැතහොත්

(ඇ) කණිෂ්ඨ කාර්මික ආයතනයක අර්ධ කාලීන—දිවා තුන් අවුරුදු පාඨමාලාව සමත් වී සිටිය යුතුය.

නැතහොත්

(ඉ) ඊට සමාන වෙනත් සුදුසුකම් තිබිය යුතුය.

5. අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම් පත් සමඟ පහත දැක්වෙන සහතිකවල පිටපත් ඇමිණිය යුතුයි.

(අ) උප්පැන්න සහතිකය.

(ආ) අධ්‍යාපන සහ කාර්මික සුදුසුකම් දැක්වෙන සහතික.

(ඇ) මෑතකදී ලබා ගන්නා ලද චරිත සහතික දෙකක්. (රජයේ සේවයේ නියුතු නිලධාරීන්ට මෙය අදාල නොවේ.)

6. රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් විසින් එවනු ලබන අයදුම් පත් සිය දෙපාර්තමේන්තු ප්‍රධානීන් මාර්ගයෙන් ඉදිරිපත් කළ කළ යුතුය. ඉහතින් සඳහන් දිනට පසුව එවන අයදුම් පත් බාර ගනු නොලැබේ. එහෙත්, දෙපාර්තමේන්තු ප්‍රධානීන්ට ලැබී ප්‍රමාදය සඳහා සැලකිය යුතු කාරණයක් ඉදිරිපත් කළහොත් පමණක් ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් බාරගනු ලැබේ.

7. අයදුම්පත් හෝ ඒ සම්බන්ධ අනෙක් ලියකියවිලි සියල්ලක්ම කම්කරු දෙපාර්තමේන්තුවේ කම්කරු කොමසාරිස්ට හැර මෙම දෙපාර්තමේන්තුවේ කිසියම් නිලධාරියෙකුගේ පුද්ගලික නමකට නොඑවිය යුතුය.

8. මෙම ගැසට් පත්‍රයේ I කොටසේ (IIඅ) ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාල වන පොදු කොන්දේසිවලට අවධානය යොමු කරවනු ලැබේ.

9. අයදුම්පත් ලැබුනු බව දන්වනු නොලැබේ. මෙහි 5 වන ඡේදයේ සඳහන් කොන්දේසිවලට පටහැනිව එවන ලද සහතික පත්වල මුල් පිටපත් ආපසු එවනු නොලැබේ.

ඩබ්. එල්. පී. ද මැල්,
කම්කරු කොමසාරිස්.

1973 අප්‍රේල් මස 05 දින,
කොළඹ, කම්කරු මහා ලේකම් කාර්යාලයේ,
කම්කරු දෙපාර්තමේන්තුවේ දීය.

ගොඩනැගිලි ඕවර්සියර් තනතුර සඳහා අයදුම් පත

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරින්) :————.
(ඒ) වාසගම :————.
(බී) අනෙක් නම් :————.

2. ලිපිනය :————.

3. උපන් දිනය :————.
(උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුයි.)

4. 1973 මැයි මස 05 දිනට වයස :—— අවුරුදු :——. මාස :——, දින :——.

5. ජාතිය :————.

(i) ලාංකික වූයේ පරම්පරාවෙන් ද ලියාපදිංචි වීමෙන් ද යනවග :————.

(ii) පරම්පරාවෙන් ලාංකිකයෙකු නම් පහත සඳහන් අය උපන් ස්ථානය සඳහන් කරන්න :————.

(ඒ) අයදුම්කරු :————.

(බී) අයදුම්කරුගේ පියා :————.

(සී) පිය පාර්ශ්වයේ මුත්තා :————.

(ඩී) පිය පාර්ශ්වයේ මීමුත්තා :————.

(අයදුම්කරු ලංකාවේ උපන්නේ නම් (ඒ) හැරුණු විට (බී) හෝ (සී) සහ (ඩී) හෝ සම්පූර්ණ කළ යුතුයි. අයදුම්කරු ලංකාවේ උපත ලැබුවේ නැතිනම් (ඒ) හැරුණුවිට (බී) සහ (සී) හෝ (සී) සහ (ඩී) සම්පූර්ණ කළ යුතුයි.)

6. විවාහකද නැද්ද යන වග :————.

7. අධ්‍යාපන සුදුසුකම් :————.

8. කාර්මික සුදුසුකම් :————.

9. පාසැලෙන් හෝ විද්‍යාලයෙන් ඉවත්වූ පසු කළ රැකියාවල් :————.

10. විශේෂ අයිතිවාසිකම්, සුදුසුකම්, පුහුණුවීමේ හෝ පළපුරුදු කම් :————.

11. ඔබේ චරිතය සහ දක්ෂතාවය ගැන සහතික කළ හැකි දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන් :————.

12. සහතික ලබාගත්තේ කාගෙන් ද ? :————.

මෙම අයදුම් පතෙහි මවිසින් සපයා ඇති කරුණු සත්‍ය හා නිවැරදි බවට සහතික කරමි. තවද, මෙහි අන්තර්ගත කරුණු අසත්‍ය හෝ වැරදි බව මා තෝරා ගැනීමට කලින් දැනගතහොත් මෙම තනතුර සඳහා නුසුදුස්සකු කිරීමට හැකි බවත්, පත් කරනු ලැබුවායින් පසු සොයා ගතහොත් කිසිම වන්දියක් නොමැතිව මා සේවයෙන් පහකර දැමිය හැකි බවත් මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

4–456—73.04.19 දින අංක 56 දරණ ගැසට් පත්‍රය

---

අංකය : සුබෝ/ආය/20.

**සුළු අපනයන බෝග දෙපාර්තමේන්තුව**

අත්හදා බැලීමේ නිලධාරි තනතුරු

1973 පෙබරවාරි මස 2 වැනි දින අංක 45 දරණ ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ පළ කරන ලද මගේ නිවේදනයෙහි දක්වා ඇති ඉහත සඳහන් තනතුරුවලට ඉල්ලුම් පත් භාර ගන්නා අවසාන දිනය 1973 අප්‍රේල් මස 27 වැනි දින දක්වා (එම දිනයත් ඇතුළුව) වැඩි දුරටත් දීර්ඝ කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

අවසාන උපාධි පරීක්ෂණයට පෙනී සිට ප්‍රතිඵල බලාපොරොත්තු වන එම ගැසට් නිවේදනය අනුව සුදුසුකම් ඇතිවන උපාධි අපේක්ෂකයින්ට ද මෙම තනතුරු සඳහා ඉල්ලුම් කළ හැක. උපාධි ප්‍රතිඵල පිට වූ විගස එම ගැසට් නිවේදනය අනුව සුදුසුකම් ලබා ඇති ඉල්ලුම්කරුවන් ඒ බව ලියාපදිංචි කළ තැපෑලෙන් වහාම සුළු අපනයන බෝග දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ වෙත දන්විය යුතුය. එසේ නොකරන අයදුම්කරුවන්ගේ ඉල්ලුම්පත්, සලකා බලනු නොලැබේ.

ආචාර්ය ර්. ජයනෙත්ති,
සුළු අපනයන බෝග අධ්‍යක්ෂ.

1973 අප්‍රේල් මස 7 වැනි දින,
කොළඹ 7, අංක 159, ධර්මපාල මාවතේ,
සුළු අපනයන බෝග දෙපාර්තමේන්තුවේ දී ය.

4-443—73.04.19 දින අංක 56 දරණ ගැසට් පත්‍රය

---

**ශ්‍රී ලංකා රජයේ වානිජ (රෙදිපිලි) නීතිගත සංස්ථාව—සළුසල**

තත්ත්ව පාලක (රෙදිපිලි) තනතුර

ඉහත සඳහන් තනතුර සඳහා ශ්‍රී ලංකාවේ පුරවැසියන්ගෙන් ඉල්ලුම් පත් කැඳවනු ලැබේ.

**සුදුසුකම් :—**

අධ්‍යාපන—රසායන විද්‍යාව, භෞතික විද්‍යාව හෝ ව්‍යවහාර ගණිතය හා ශුද්ධ ගණිතය සහිතව විද්‍යාව පිළිබඳ විශ්ව විද්‍යාල උපාධියක්.

අයදුම්කරුවන්ට පහත සඳහන් වෘත්තීය සුදුසුකම් වලින් එකක් හෝ කිහිපයක් තිබිය යුතුය.

(අ) එංගලන්තයේ ටෙක්ස්ටයිල් ඉන්ස්ටිට්යුට්හි ආශ්‍රිත සාමාජිකයෙකු වීම හෝ

(ආ) තුන් අවුරුදු පළපුරුද්දක් සහිතව රෙදිපිලි සම්බන්ධයෙන් පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධියක් තිබීම හෝ

(ඇ) අවුරුදු හයක පළපුරුද්දක් සහිතව වී. ජේ. ටී. අයි. හෝ ඒ සමාන ඩිප්ලෝමාවක් තිබීම.

(ඈ) රෙදිපිලි අලෙවි කටයුතු ගැන දැනුම/සහ හෝ පළපුරුද්ද අතිරේක සුදුසුකමක් ලෙස සැලකේ.

**වයස :** 1973 මැයි 10 වෙනිදාට අවුරුදු 23ට නොඅඩු හා 45ට නොවැඩි විය යුතුය.

**වැටුප් පරිමාව :** රු. 900 — 7×50 — රු. 1,250 (සියලු දීමනා සහිත මාසික වැටුප) අතිරේක සුදුසුකම් හා පළපුරුද්ද ඇති පුද්ගලයින් ඉහත වැටුප් පරිමාව අනුව සුදුසු යයි සලකන වැටුප් තලයක තබනු ලැබේ.

අයදුම්කරුවන් තම වයස, අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් පාසැල හැර යාමෙන් පසුව කළ රක්ෂා සහ පළපුරුද්ද පිළිබඳ සියලු විස්තර සැපයිය යුතු අතර, සහතික හා ලියකියවිලිවල පිටපත් පමණක් (මුල් පිටපත් නොවේ) ඉදිරිපත් කළ යුතුය.

දැනටමත් රජයේ සේවයේ, රාජ්‍ය සංස්ථාවල හෝ ව්‍යවස්ථාපිත මණ්ඩලවල සිටින පුද්ගලයින් ඒ ඒ අංශ ප්‍රධානීන් මාර්ගයෙන් තම අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.

තෝරා ගත් අයදුම්කරුවා රජයේ භාෂා ප්‍රතිපත්තියට අනුකූලව හා විශේෂයෙන්ම 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනතේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධව දැනටමත් පනවා ඇති හෝ මින් ඉදිරියට පනවන ඕනෑම රෙගුලාසියකට යටත්ව සේවය කිරීම අවශ්‍යවේ.

සියලුම ඉල්ලුම් පත් 1973 මැයි මස 10 වෙනිදාට හෝ ඊට පෙර පහත අත්සන් කරන මා වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. මේ සම්බන්ධයෙන් 1973 ජනවාරි 12 වෙනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ පළවූ දැන්වීම පරිදි ඉල්ලුම් පත් එවා ඇති අය නැවත ඉල්ලුම් පත් එවීම අනවශ්‍ය බව සලකත්වා.

සභාපති.

ශ්‍රී ලංකා රජයේ වාණිජ (රෙදිපිලි) නීතිගත සංස්ථාව—සළුසල,
93, ජාවත්ත පාර,
කොළඹ 5.

4–511—73.04.19 දින අංක 56 දරණ ගැසට් පත්‍රය

---

**ජාතික පේෂකර්ම සංස්ථාව**

ආරක්ෂක නිලධාරි තනතුර

**වයස.**—අවුරුදු 45 අඩුවිය යුතුයි.

**සුදුසුකම් හා පළපුරුද්ද.**—ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකය හෝ ඊට සමාන සුදුසුකමක් සහිත විශාල කම්කරු පිරිසක් සේවයේ යොදවා ඇති වෙළඳ හෝ රජයේ කාර්මික ආයතනයක කම්කරු පාලනය සහ/හෝ ආරක්ෂක කටයුතු පිළිබඳ අධීක්ෂණ තත්වයේ අවුරුදු 10 ක පළපුරුද්ද.

**වැටුප් පරිමාණය.**—මසකට සියළු දීමනා සහිතව රු. 550—10×25—රු. 800.

දැනට රජයේ සේවයේ හෝ සංස්ථා සේවයේ හෝ යෙදී සිටින අයදුම්කරුවන් ඒ ඒ දෙපාර්තමේන්තු හෝ සංස්ථා ප්‍රධානීන් මගින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.

අයදුම්පත් ඉදිරිපත් කිරීමේදී අයදුම්කරුවන් විසින් ඔවුන්ගේ වයස, අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම් හා පැහැලෙන් අත්වූ පසු කරන ලද රැකියා පිළිබඳ සම්පූර්ණ විස්තර හා සහතිකයන්හි හා චරිත සහතිකයන්හි පිටපත්ද (මුල් පිටපත් නොවේ) අයදුම්පත් වල සඳහන් කරුණු සනාථ කිරීම සඳහා ඉදිරිපත් කළ යුතුය.

අයදුම්පත් 1973 අප්‍රේල් මස 30 වෙනි දින ප.ව. 4 ට හෝ ඊට පෙර හෝ ජ්‍යෙෂ්ඨ පිරිස් නිලධාරි, ජාතික පේෂකර්ම සංස්ථා මෝල, වෙයන්ගොඩ යන ලිපිනයට, ලැබෙනසේ ලියා පදිංචි තැපෑලෙන් එවිය යුතුය.

ලියුම් කවරයේ වම් පැත්තේ උඩ කෙලවරේ අයදුම්කරු ඉල්ලුම් කර සිටින තනතුරේ නම ලොකු අකුරින් හා පැහැදිලිව සඳහන් කළ යුතුය.

සේවක මණ්ඩල කළමනාකරු.

4-490—73.04.19 දින අංක 56 දරණ ගැසට් පත්‍රය

---

**අම්පාර දිස්ත්‍රික්කයේ කරුන්කොඩිතිවු කොට්ඨාශයේ උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර් ධූරය**

කරුන්කොඩිතිවු උප්පැන්න හා මරණ ලියා පදිංචි කිරීමේ කොට්ඨාශය තුළ ස්ථිර පදිංචියක් ඇත්තාවූ හෝ එහි පදිංචිව සැහෙන දේපලක් ද, ගම්වාසීන්ගේ සැලකිල්ල ද අත්කර ගෙන ඇත්තාවූ හෝ ස්ත්‍රී, පුරුෂ දෙපක්ෂයෙන් ඉහත සඳහන් ඇබෑර්තුව සඳහා ඉල්ලුම් පත් කැඳවනු ලැබේ. ඉල්ලුම් පත් භාරගන්නා අවසාන දිනට අයදුම්කරුවන්ගේ වයස අවුරුදු 21 ට අඩු නොවිය යුතුය. රජයේ ස්ථිර සේවයේ නියුක්ත අයදුම්කරුවන් සඳහා මෙම වයස් සීමාව බල නොපායි.

2. අධ්‍යාපක හා අනිකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර මෙම කායසීලයේ සහ ප්‍රාදේශීය ආදායම් නිලධාරී කාර්යාල, ග්‍රාම සේවක කාර්යාල, පලාත් පාලන ආයතන කාර්යාල, ගම්බද උසාවි, තැපැල් කාර්යාල, පොලිස් ස්ථාන, ප්‍රජාමණ්ඩල, ප්‍රසිද්ධ වෙළඳ පොලවල් සහ සමූපකාර සමිති ආදියෙහි ප්‍රදර්ශනය කර ඇති දැන්වීම් වලින් බලා ගත හැකිය.

3. සියළුම ඉල්ලුම් පත් මෙම කාර්යාලයෙන් ලබා ගත හැකි ආකෘති පත්‍රවල ලියා, ඒවා ලියා පදිංචි තැපෑලෙන් 1973 මැයි මස 21 දින හෝ එදිනට පෙර හෝ මා වෙත ලැබෙන ලෙස එවිය යුතුය.

සෝමසිරි මුණසිංහ,
අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්,
දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් වෙනුවට.

1973 අප්‍රේල් මස 5 දින,
අම්පාර දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්,
කාර්යාලයේ දී ය.

4-482—73.04.19 දින අංක 56 දරණ ගැසට් පත්‍රය

---

**ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ වරාය ග්‍රාම කොට්ඨාශයේ උප්පැන්න හා මරණ ලේකම් ධූරය**

වරාය ග්‍රාම, උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාශය තුල ස්ථිර පදිංචියක් ඇත්තාවූ හෝ එහි කාලයක් පදිංචිව සිටීම හේතු කොටගෙන ගම්වාසීන්ගෙන් සැලකුම් ලබන, ඉල්ලුම් පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු විසිඑකට නොඅඩු ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයෙන්ම ඉහත සඳහන් ධූරය සඳහා ඉල්ලුම් පත් කැඳවනු ලැබේ. රජයේ සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා මෙම වයස් සීමාව අදාල නොවේ.

2. මෙම ධූරය සඳහා ඉදිරිපත් වන අයට තිබිය යුතු අධ්‍යාපනික හා අනෙකුත් සුදුසු කම් ආදිය පිළිබඳ සියලු විස්තර මෙම කාර්යාල යේ සහ ප්‍රාදේශිය ආදායම් පාලක නිලධාරි කායසීලය, ග්‍රාමසේවක කායසීලය, පලාත් පාලන ආයතන කායසීල, ග්‍රාමීය උසාවි, තැපැල් කාර්යාල, පොලිස් ස්ථාන සහ ප්‍රජා මණ්ඩල, ප්‍රසිද්ධ වෙළඳ පොල වල් සහ සමුපකාර සමිති ආදී කොට්ඨාශයේ ප්‍රසිද්ධ ස්ථාන සහ කායසීලය වල ප්‍රදර්ශණය කර ඇති දැන්වීම් වල ඇතුලත් වේ.

3. සියලුම ඉල්ලුම් පත් මෙම කායසීලයෙන් ලබා ගත හැකි ආකෘතිපත්‍ර වල සකස් විය යුතු අතර, ඒවා 1973 නේ මැයි මස 24 වෙනි දිනට හෝ ඊට පෙර මා වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑ ලෙන් එවිය යුතුය.

තිස්ස දේවේන්ද්‍ර,
දිස්ත්‍රික් රෙජිස්ටරාර්.

1973 අප්‍රේල් මස 05 වන දින,
ත්‍රිකුණාමලේ දිස්ත්‍රික් රෙජිස්ටරාර් කාර්යාලයේ දී ය.

4-469—73.04.19 දින අංක 56 දරණ ගැසට් පත්‍රය

---

**මඩකලපුව දිස්ත්‍රික්කයේ අරුමුගත්තාන්කුඩියිරුප්පු කොට්ඨාශයේ උප්පැන්න හා මරණ සහ එරාවූර් සහ කෝරළ පත්තු කොට්ඨාශයේ විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධූරය**

ආරුමුගත්තාන්කුඩියිරුප්පු උප්පැන්න හා මරණ ලියා පදිංචි කිරීමේ කොට්ඨාශය තුළ ස්ථිර පදිංචියක් ඇත්තාවූ හෝ එහි පදිංචි වී සැහෙන දේපලක් ද, ගම්වාසීන්ගේ සැලකිල්ල ද අත්කර ගෙන ඇත්තාවූ හෝ ස්ත්‍රී, පුරුෂ දෙපක්ෂයෙන් ඉහත සඳහන් ඇබෑර්තුව සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ. ඉල්ලුම් පත් භාර ගන්නා අවසාන දිනට අයදුම්කරුවන්ගේ වයස අවුරුදු 21 ට අඩු නොවිය යුතුය. රජයේ ස්ථිර සේවයේ නියුක්ත අයදුම්කරුවන් සඳහා මෙම වයස් සීමාව බල නොපායි.

2. අධ්‍යාපනික හා අනිකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර මෙම කාර්යාලයේ සහ ප්‍රාදේශිය ආදායම් නිලධාරි කාර්යාල, ග්‍රාම සේවක කාර්යාල, පලාත් පලන ආයතන කාර්යාල, ගම්බද උසාවි, තැපැල් කාර්යාල, පොලිස් ස්ථාන, ප්‍රජාමණ්ඩල, ප්‍රසිද්ධ වෙළඳ පොළවල් සහ සමූපකාර සමිති ආදියෙහි ප්‍රදර්ශනය කර ඇති දැන්වීම් වලින් බලා ගත හැකිය.

3. සියලුම ඉල්ලුම් පත් මෙම කාර්යාලයෙන් ලබා ගත හැකි ආකෘති පත්‍රවල ලියා ඒවා ලියාපදිංචි තැපෑලෙන් 1973. 05. 15 දින හෝ එදිනට පෙර හෝ මා වෙත ලැබෙන ලෙස එවිය යුතුය.

ආර්. බී. වීරකෝන්,
දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්.

1973 අප්‍රේල් මස 03 දින,
මඩකලපුව දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ දීය.

4-458—73.04.19 දින අංක 56 දරණ ගැසට් පත්‍රය

---

**තෙල්ලිප්පලෙයි හා මයිලිඩ්ඩි ප්‍රදේශයන්ට හදිසි මරණ පරීක්ෂවරුන් පත්කිරීම**

තෙල්ලිප්පලෙයි හා මයිලිඩ්ඩි යන ගම් සහා ප්‍රදේශයන්ට හදිසි මරණ පරීක්ෂක තනතුරු සඳහා හදිසි මරණ පරීක්ෂකවරුන් දෙදෙනෙක් පත් කිරීම පිණිස එම ගම් සභා ප්‍රදේශ තුළ ස්ථිර පදිංචි කරුවන්ගෙන් පමණක් ඉල්ලුම්පත් යාපනය දිසාපති විසින් භාරගනු ලැබේ.

2. රජයේ, සංස්ථා සහ පළාත් පාලන ආයතනවල සේවකයන්ගෙන් පළාත් පාලන ආයතනවල නියෝජිතයින්ගෙන් සහ 73.04.30 වැනි දිනට වයස අවුරුදු 30 ට අඩු හෝ 60 ට වැඩි අයගෙන් අයදුම්පත් භාරගනු නොලැබේ.

3. සෑම අයදුම්කරුවකු විසින්ම පහත සඳහන් විස්තර හා ලිය කියවිලි සැපයිය යුතුව ඇත.

(i) සම්පූර්ණ නම සහ ලිපිනය :————.

(ii) පදිංචි ස්ථානය :————.

(iii) වයස සහ උපන් දිනය :————.

(iv) විවාහකද අවිවාහකද යනවග :————.

(v) අධ්‍යාපන සුදුසුකම් : ඉංග්‍රීසි :————.
දෙමළ :————.

(vi) දැනට දරන හෝ කලින් දැරූ තනතුර හෝ තනතුරු :————.

(vii) මෑතක දී ලබාගත් චරිත සහතික දෙකක් :————.

එම්. ඊ. ඩබ්. අමරසේකර,
යාපනය දිසාපති.

1973 අප්‍රේල් මස 04 දින,
යාපනය දිසාපති කාර්යාලයීය
පාලන ශාඛාවේ දී.

4-417—73.04.19 දින අංක 56 දරණ ගැසට් පත්‍රය

**ලංකාවේ චාර්ටඩ් ගණකාධිකාරීන්ගේ ආයතනයේ පරීක්ෂණවලට රජයේ නිලධාරීන් පුහුණු කිරීමේ පහසුකම් ප්‍රදානය කිරීම**

චාර්ටඩ් ගණකාධිකාරීන්ගේ ආයතනයෙහි පුහුණු කරවීමට, තම පත්වීම්වල, ස්ථිර කර ඇත්තාවූ ද, මේ නිවේදනයේ 2 වන ඡේදයෙහි දක්වා ඇති සුදුසුකම් ඇත්තාවූ ද, රජයේ සේවකයන්ගෙන් ඉල්ලුම් පත් කැඳවනු ලැබේ.

**පුහුණුවීමේ පාඨමාලාව 1973 ජූලි 1 වන දින ආරම්භ වේ.**

2. **අවශ්‍ය සුදුසුකම්.**—(අ) වයස: 1973 ජූලි 1 වන දිනට අවුරුදු 40 ට වැඩි නොවීම.

(ආ) අධ්‍යාපනික සුදුසුකම්.—පහත සඳහන් අධ්‍යාපනික සුදුසුකම් වලින් එකක්වත් ලබා සිටිය යුතුය.

(i) ආයතනයේ මණ්ඩලය මගින් අනුමත විශ්ව විද්‍යාලයක උපාධියක් ;

(ii) ලංකා උසස් පාඨශාලා සහතිකය ;

(iii) ලංකා කාර්මික විද්‍යාලයේ ගණකාධිකරණය පිළිබඳ ඩිප්ලෝමා සහතිකය ;

(iv) ලංකා හෝ ලන්ඩන් විශ්ව විද්‍යාලයේ අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ ගණිතය ඇතුලුව දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් 4 කින් සාමර්ථය හෝ උසස් පෙළ විෂයයන් හතරෙන් ගණිතයට සම්මාන සාමර්ථයක් නොමැති නම් අධ්‍යයන පොදු සහතික (සාමාන්‍ය පෙළ) විභාගයේදී අංක ගණිතය, වාණිජ අංක ගණිතය හෝ ගණිතය යන විෂයයෙන් එකකට සම්මාන සහිතව සාමාර්ථය.

(ඇ) රජය යටතේ සේවය :—

(i) **රජයේ ගණකාධිකාරී සේවයේ හෝ ගිණුම් පරීක්ෂක සේවයේ හෝ සාමාජිකයෙකු ;**

(ii) **1973 ජූලි 1 වන දිනට අඩු වශයෙන් අවුරුදු පහක සේවයක් සහිත ආයතනයේ මණ්ඩලය මගින් පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධිධරයෙකු ; හෝ**

(iii) **1973 ජූලි 1 වන දිනට අඩු වශයෙන් අවුරුදු පහක** සේවය සහිත ලංකා කාර්මික විද්‍යාලයේ ගණකාධිකරණ **ඩිප්ලෝමා සහතිකධාරියෙකු ; හෝ**

වශයෙන් විය යුතුය.

ගණකාධිකරණය සහ/හෝ ගිණුම් පරීක්ෂක වැඩ පිළිබඳ පෙර පුහුණුවක් ඇති අයට වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

3. **තෝරා ගනු ලබන ආකාරය.**—නියමිත පරිදි පත් කරන ලද තේරීම් මණ්ඩලයකින් පවත්වනු ලබන සම්මුඛ පරීක්ෂණයකින් තේරීම් කරනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයේ වේලාව සහ ස්ථානය ඉල්ලුම්කරුවන්ට දන්වනු ඇත.

4. **තෝරා ගනු ලබන ශිෂ්‍යයින් සංඛ්‍යාව.**—පහසුකම් තිබෙන ආකාරයට, අපේක්ෂකයින් 3 දෙනෙකුට නොවැඩි ගණනක් තෝරා ගනු ලැබේ.

5. **පුහුණුවීම්.**—ලංකාවේ චාර්ටඩ් **ගණකාධිකාරී ආයතනය මඟින්** පුහුණුවීමට විධිවිධාන **යොදනු ලැබේ.**

**පුහුණුවීමේ කාලය මෙසේ ය :—**

(i) ආයතනයේ මණ්ඩලය මගින් පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධිධරයෙකු වෙනුවෙන් අවුරුදු 3 කි.

(ii) වෙනත් අවස්ථාවන්හි දී අවුරුදු 4 කි.

6. මෙම පුහුණුවීමේ පහසුකම් සාර්ථක ලෙස සම්පූර්ණ කිරීමෙන් පසුව, විශාන සේවයට බැඳීමට කැමැත්ත දක්වන නිලධාරීන් හැර අනිකුත් නිලධාරීන් ගණකාධිකාරී සේවයේ IV වැනි පන්තියට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

7. **ශිෂ්‍යත්වයේ කොන්දේසි :—**

(අ) ශිෂ්‍යත්ව සඳහා තෝරාගනු ලබන ශිෂ්‍යයෙකු විසින් පුහුණුවීමේ පාඨමාලාව සාර්ථක ලෙස සම්පූර්ණ කිරීමෙන් පසු අවුරුදු දහයක (10) කාලයක් රජයේ ගණකාධිකාරී සේවයේ හෝ අවශ්‍ය වුවහොත් ගණන් පරීක්ෂක සේවයේ හෝ සේවය කරන බවට පොරොන්දු පත්‍රයකට ඇතුළත් විය යුතුය.

(ආ) ආයතනයට ගෙවිය යුතු ඉගැන්වීමේ ගාස්තු, විභාග ගාස්තු අධ්‍යාපනික හා තැපැල් මාර්ගික පාඨමාලාමය වියදම් රජය විසින් ගෙවනු ඇත. පුහුණුව හා අදාල අනෙකුත් අතියම් වියදම් අපේක්ෂකයා විසින්ම දැරිය යුතු වේ. තෝරාගනු ලබන අපේක්ෂකයනට අවුරුදු දෙකක සම්පූර්ණ වැටුප් සහිත නිවාඩු දෙනු ලැබේ. තවද, චාර්ටඩ් ගණකාධිකාරී ආයතනයේ මධ්‍ය පරීක්ෂණයෙන් අවුරුදු දෙකේ කාල සීමාව ඇතුලත දී සමත්වන අයදුම්කරුවනට රාජ්‍ය පරිපාලන අධ්‍යක්ෂ ජනරාල් තැනගේ අභිමතය පරිදි තවදුර කාලසීමාවකට සම්පූර්ණ වැටුප් සහිත නිවාඩු දෙනු ඇත.

(ඇ) ශිෂ්‍යත්වය පහත සඳහන් කොන්දේසි එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ යටතේ නැවැත්වීමට පුළුවන :—

(i) ආයතනය මගින් පවත්වනු ලබන හැඳින්වීමේ දේශන පාඨමාලාව හා අධ්‍යයන පාඨමාලාවන් චාර්ටඩ් ගණකාධිකාරී ආයතනයේ මණ්ඩලය සෑහීමට පත් වන සේ සම්පූර්ණ කිරීමට අයදුම්කරුවකු අපොහොසත් වුවහොත්, පාඨමාලාවට ඇතුළත්වීමට ඉඩ නොදෙනු ඇත.

(ii) ලංකාවේ චාර්ටඩ් ගණකාධිකාරී ආයතනයේ රෙගුලාසි යටතේ පුහුණුවීම අවසන් වීමෙන්.

(iii) ලංකාවේ චාර්ටඩ් ගණකාධිකාරී ආයතනයේ රෙගුලාසි යටතේ මධ්‍යම විභාගයට පෙනී සිටීමට සුදුසු වී අවුරුද්දක් ඇතුළත එම විභාගය සාර්ථක ලෙස සම්පූර්ණ කිරීමට අපේක්ෂකයා අපොහොසත් වී නම්,

(iv) චාර්ටඩ් ගණකාධිකාරී ආයතනයේ 1960 රෙගුලාසි (නො. 2) හි 28 වන රෙගුලාසියේ විධිවිධාන යටතේ ආයතනය විසින් පුහුණුවීම නවත්වන ලද නම්,

(v) ආයතනයේ 15(2) රෙගුලාසිය අනුව අපේක්ෂකයා නුසුදුසුයයි සලකනු ලැබුවහොත්,

(ඈ) අපේක්ෂකයකුහට ඉහත 7(ඇ) ඡේදයෙහි (i) වගන්තිය යටතේ පාඨමාලාවට ඇතුළුවීමට ඉඩ නොදුනහොත් හෝ ඉහත (iii) (iv) හෝ (v) යටතේ අපේක්ෂකයෙකුගේ පුහුණුවීම අවසන් කරනු ලැබුවහොත් හෝ ඔහුගේ ශිෂ්‍යත්වය අවලංගුකරනු ලබන අතර එසේ අවලංගු කරනු ලබන දිනය දක්වා ඔහුගේ පුහුණුවීම වෙනුවෙන් රජය මගින් දරන ලද සියළුම වියදම් හා පුහුණුවීමේ කාලසීමාව තුළ දී ඔහුට ගෙවන ලද වැටුප් හා දීමනාදිය ද ඔහු විසින් රජයට ආපසු ගෙවිය යුතු වේ.

8. පහත දැක්වෙන ආකෘතිපත්‍රය ආකාරයට විය යුතු සියලුම **ඉල්ලුම් පත්‍ර 1973 මැයි මස 21 වැනි දින හෝ ඊට ප්‍රථම කොළඹ 7, නිදහස් චතුරශ්‍රයේ අංක 'සී' දරණ ගොඩනැගිල්ලේ, ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ වෙත එවිය යුතුය.**

9. **සියලුම ඉල්ලුම් පත්‍ර ඉල්ලුම්කරු සේවය කරන** දෙපාර්තමේන්තු **ප්‍රධානියා මාර්ගයෙන් එවිය යුතුය. කෙසේ වුවද, ඉල්ලුම්** පත්‍රයේ පිටපතක් කෙළින්ම රාජ්‍ය පරිපාලන අධ්‍යක්ෂ ජනරාල් වෙත එවිය යුතුයි.

10. **සියලුම ඉල්ලුම් පත්‍ර ලැබුණු බව දන්වනු ලබන අතර ඉල්ලුම් පත්‍ර** භාර ගන්නා අවසාන දින සිට දින තුනක් ඇතුළත **ඉල්ලුම් පත්‍ර ලැබුණු බවට දැන්වීමක් නොලැබුණහොත් වහාම ඒ බව** රාජ්‍ය පරිපාලන අධ්‍යක්ෂ ජනරාල් වෙත දැනුම් දිය යුතුය.

පී. එච්. සිරිවර්ධන,
වැඩබලන රාජ්‍ය පරිපාලන, පළාත් පාලන සහ ස්වදේශ **කටයුතු අමාත්‍යාංශයේ ලේකම් සහ**
වැඩබලන රාජ්‍ය පරිපාලන අධ්‍යක්ෂ ජනරාල්.

**1973 අප්‍රේල් මස 09 වැනි දින,**
**කොළඹ 7, නිදහස් චතුරශ්‍රයේ**
**රාජ්‍ය පරිපාලන දෙපාර්තමේන්තුවේදීය.**

**8 වන ඡේදයෙහි සඳහන් ඉල්ලුම් පත් ආකෘතිපත්‍රය**

**ලංකාවේ චාර්ටඩ් ගණකාධිකාරීන්ගේ ආයතනයේ පරීක්ෂණවලට රජයේ නිලධාරීන් පුහුණු කිරීමේ පහසුකම් ප්‍රදානය කිරීම**

1. සම්පූර්ණ නම :————.
   (අ) වාසගම :————.
   (ආ) අනෙකුත් නම් :————.
2. තැපැල් ලිපිනය :————.
3. උපන් දිනය:————.
4. අධ්‍යාපනික සුදුසුකම් :————.
5. දරණ තනතුරේ විස්තර :————.
   (අ) දෙපාර්තමේන්තුව :————.
   (ආ) දැනට දරණ තනතුර :————.

(ඈ) ස්ථිර සේවයට පළමුවෙන් පත් වූ දිනය :————.

(ඇ) දරණ ලද වෙනත් තනතුරු :————.

(ඉ) දැනට දරණ පත්වීමෙහි ස්ථිර කර ඇත් ද? :————.

(ඊ) ස්ථිර සේවා කාලය :————.

6. විශේෂ හිමිකම් පිළිබඳ විස්තර :- ————.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශ.—(ඉල්ලුම් පත් ඉදිරිපත් කිරීමේදී දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් 3 සහ 5 වන කොටස්වල විස්තර නිවැරදි බව සහතික කළ යුතු අතර, ඉල්ලුම්කරුවන්ගේ වැඩ සහ හැසිරීම සතුටුදායක ද යන බව සඳහන් කළ යුතුය.)

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන හා පදවි නාමය.

දිනය :————.

4-503—73.04.19 දින අංක 56 දරණ ගැසට් පත්‍රය

---

## ලංකා ප්‍රමිති කාර්යාංශය

### පුරප්පාඩු

ලංකා ප්‍රමිති කාර්යාංශයේ පහත සඳහන් තනතුරු සඳහා නියමිත සුදුසුකම් ඇති ලාංකිකයන්ගෙන් අයදුම් පත් කැඳවනු ලැබේ.

**1. තනතුර.**—සෝධ්‍ය පත්‍ර කියවන්නා (ඉංග්‍රීසි)

**වයස.**— අවුරුදු 35 ට නොවැඩිනම් මැනවි.

**සුදුසුකම්.**—ඉංග්‍රීසි " සම්මාන " සාමාර්ථයක් ද, සිංහල " සාමාන්‍ය " සාමාර්ථයක් ද සහිත දෙවතාවකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් සාමාර්ථය ලත් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ)

මුද්‍රණ, ප්‍රචාරක, ප්‍රකාශන ආදිය හා හෝ ඒවාට අදාල ඒ සම්බන්ධ අවුරුදු 3 ක පලපුරුද්දක්.

වැටුප් ක්‍රමය.—රු. 325—රු. 10×7 රු. 395 (සියල්ල අඩංගු මාසික)

**2. තනතුර.**—ලඝුලේඛක—ටයිප් ගසන්නා (3 වෙනි ශ්‍රේණිය)—ඉංග්‍රීසි

**වයස.**—අවුරුදු 35 ට නොවැඩි නම් මැනවි.

**සුදුසුකම්.**—(i) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකය හෝ එක් වතාවක දී විෂයයන් 6කින් සාමර්ථය ලත් අධ්‍යයන පොදු සහතිකය (සාමාන්‍ය)

(ii) ඉංග්‍රීසි පිළිබඳ වැඩ කිරීමේ දැනුම සහිත මිනිත්තුවකට ඉංග්‍රීසි වචන 85ක් ලඝුලේඛනය කිරීමේ හා වචන 40ක් ටයිප් කිරීමේ හැකියාව.

(iii) සිංහලෙන් ටයිප් කිරීමේ හැකියාව.

**වැටුප් ක්‍රමය** : රු. 325—රු. 10×7—රු. 395 (සියල්ල අඩංගු මාසික)

**3. තනතුර.**—ටයිප් ගසන්නා (3 වෙනි ශ්‍රේණිය)—ඉංග්‍රීසි

**වයස.**—අවුරුදු 35ට නොවැඩි නම් මැනවි.

සුදුසුකම්.—ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකය හෝ ඊට සමාන සහතිකයක් ඉංග්‍රීසි පිළිබඳ වැඩ කිරීමේ දැනුම සහිත මිනිත්තුවකට ඉංග්‍රීසි වචන 40ක් ටයිප් ගැසීමේ හැකියාව.

අවුරුදු 5කට නොඅඩු පළපුරුද්ද.

සිංහල ටයිප් ගැසීමේ සාමාන්‍ය හැකියාව (සේවයේ ස්ථිර කරනුයේ ආධුනික කාලය තුළදී මිනිත්තුවකට සිංහල වචන 25 ක් ටයිප් ගැසීමේ හැකියාව ලැබීමෙන් පසුවය).

**වැටුප් ක්‍රමය.**—රු. 325—රු. 10×7—රු. 395 (සියල්ල අඩංගු මාසික)

### පොදු කොන්දේසි

(1) අයදුම්කරුවන් ලාංකිකයින් විය යුතු ය.

(2) අර්ථසාධක අරමුදලට දායකවීම්—සියයට 6 ක් නිලධාරියාගෙන් හා සියයට 9 ක් කාර්යාංශයෙන්.

(3) මෙම දැන්වීමේ සඳහන් ආදර්ශ අයදුම් පත්‍රය අනුව අයදුම් පත් සකස් කළ යුතුවේ. අයදුම් පත්‍රය සමග සහතික පත්වල (මුල් පිටපත් නොව) එවිය යුතු ය.

(4) ඒ ඒ තනතුරුවලට වෙන වෙනම අයදුම් පත්‍ර ඉදිරිපත් කළ යුතු වේ.

(5) ඉල්ලුම් පත්‍රයෙහි තමන් ඉල්වන නිලයට අදාළ කොටස් පමණක් පිරවිය යුතු වේ.

(6) තෝරාගනු ලබන අපේක්ෂකයින් 1956 අංක 33 දරන රාජ්‍ය භාෂා පනතේ විධිවිධානවලටත් රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීම සඳහා දැනටම පවත්නා සියලුම නීතිරීති හා ව්‍යවස්ථාවලටත් මතුවට පනවනු ලබන නීතිරීති හා ව්‍යවස්ථාවලටත් එකඟව කටයුතු කිරීමේ කොන්දේසිය පිළිගත යුතුය.

(7) තෝරා ගන්නා අපේක්ෂකයින් අවුරුදු 3ක ආධුනික කාලයකට යටත් ය.

(8) රජයේ සේවයේ හෝ රජයේ සංස්ථාවල හෝ ව්‍යවස්ථාපිත මණ්ඩලවල හෝ පර්යේෂණ ආයතනවල හෝ විශ්වවිද්‍යාලවල හෝ සිටින නිලධාරීන් තම ඉල්ලුම් පත්‍ර එම දෙපාර්තමේන්තුවල හෝ සංස්ථාවල හෝ ව්‍යවස්ථාපිත මණ්ඩලවල හෝ පර්යේෂණ ආයතනවල හෝ විශ්වවිද්‍යාලවල හෝ ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතු අතර ඔවුන් තෝරා ගැනුණහොත් නිදහස් කිරීමට එකඟදැයි නිශ්චිත වශයෙන් දැන්විය යුතුය. මේ ආකාරයට දැන්වීමක් නොමැති අයදුම් පත් ප්‍රතික්ෂේප කරනු ඇත.

(9) අයදුම් පත්‍රයේ අසත්‍ය දේ ප්‍රකාශ කර, එම අසත්‍ය ප්‍රකාශයන් තෝරා ගැනීමට පෙර සොයාගනු ලැබුවහොත් අයදුම්කරු නුසුදුස්සෙකු බවට පත්වන අතර, පත්වීම ලැබීමෙන් පසුව සොයා ගනු ලැබුවහොත් අයදුම්කරු සේවයෙන් පහ කරනු ඇත.

(10) මෙම දැන්වීමේ සඳහන් අවශ්‍යතාවන්ට නියම ලෙස අනුකූල නැති සියළුම ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂේප කරනු ඇත.

(11) ඉල්ලුම් පත්‍රය බහා එවනු ලබන ලියුම් කවරයේ උඩ වම් කෙළවරේ ඉල්ලුම් කරන නිලය සඳහන් කළ යුතු වේ.

(12) ඉල්ලුම් පත්‍ර ලැබුණු බව දන්වා එවනු නොලැබේ.

(13) ඉල්ලුම් පත්‍ර 1973.05.11 වෙනි දින හෝ ඊට පෙර අධ්‍යක්ෂ, ලංකා ප්‍රමිති කාර්යාංශය, 53, ධම්පාල මාවත, කොළඹ 3 වෙත ලියාපදිංචි කළ තැපැලෙන් එවිය යුතුය.

අධ්‍යක්ෂ,
ලංකා ප්‍රමිති කාර්යාංශය.

### ආදර්ශ අයදුම් පත්‍රය

### ලංකා ප්‍රමිති කාර්යාංශය

1. ඉල්ලුම් කරන තනතුර :————.

2. සම්පූර්ණ නම (අගට යෙදෙන නාමය මුලට) :————.

3. ලිපිනය :————.

4. උපන් දිනය :————.

5. ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසාන දිනට වයස :—
අවු :————, මාස :————, දිනය :————.

6. ජාතිය :————.

7. සුදුසුකම් :—

(i) අධ්‍යාපනික (විෂයයන් සමග) :————.

(ii) ශාස්ත්‍රාලයීය (දිනය, විෂයයන් හා ආයතනය සමග) :————

(iii) වෘත්තීය (දින හා ආයතනය සමග) :————.

8. රැකියා වාර්තාව (දැරූ නිල සහ ලැබූ වැටුප් පිළිබඳ විස්තර දිය යුතු ය) :————.

9. පළපුරුද්ද :————.

10. විශේෂ සුදුසුකම් :————.

11. සිංහල ප්‍රවීණතාව :————.

මෙම ඉල්ලුම් පත්‍රයේ මා විසින් සඳහන් කර ඇති සියළුම විස්තර සත්‍ය වූද නිවැරදි වූ ද ඒවා බව මෙයින් සහතික කරමි. එමෙන් ම මෙහි සඳහන් විස්තර අසත්‍ය හෝ වැරදි හෝ ඒවා බව තෝරා ගැනීමට පෙර සොයා ගනු ලැබුවහොත් නුසුදුස්සෙකු වන බව ද පත්වීම ලැබුවාට පසු මෙහි සඳහන් විස්තර අසත්‍ය හෝ වැරදි හෝ ඒවා බව සොයා ගනු ලැබුවහොත් නුසුදුස්සෙකු වන බව ද පත්වීම ලැබුවාට පසු මෙහි සඳහන් විස්තර අසත්‍ය හෝ වැරදි හෝ ඒවා බව සොයා ගනු ලැබුවහොත් කිසිම වන්දියක් නොමැතිව සේවයෙන් පහ කිරීමට ඉඩ ඇති බව ද මම දනිමි.

————————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

* අධ්‍යක්ෂ මහතා,
ලංකා ප්‍රමිති කාර්යාංශය.

තෝරා ගැනුණ හොත් අයදුම්කරු නිදහස් කළ හැක/නොහැක.

————————,
දෙපාර්තමේන්තු/සංස්ථා/ව්‍යවස්ථාපිත/මණ්ඩල/පර්යේෂණ ආයතන/විශ්ව විද්‍යාල/ප්‍රධානියා.

දිනය :————.

* අයදුම්කරු රජයේ සේවයේ හෝ රජයේ සංස්ථාවක හෝ ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ පර්යේෂණ ආයතනයක හෝ විශ්ව විද්‍යාලයක හෝ සේවයේ නියුතු වූ අයෙකු නම් මෙම කොටස පිරවිය යුතු වේ. නැතහොත් අයදුම් පත ප්‍රතික්ෂේප කරනු ඇත.

4-555—73.04.19 දින අංක 56 දරණ ගැසට් පත්‍රය

---

### සමාගම් රෙජිස්ත්‍රාර් දෙපාර්තමේන්තුව

#### සහකාර සමාගම් රෙජිස්ත්‍රාර් තනතුර

සමාගම් රෙජිස්ත්‍රාර් දෙපාර්තමේන්තුවේ සහකාර සමාගම් රෙජිස්ත්‍රාර් තනතුරක් සඳහා ඉල්ලුම් පත් එවන ලෙස මෙයින් ආරාධනය කරනු ලැබේ. මෙම ගැසට් පත්‍රයෙහි සඳහන් කර ඇති ආදර්ශ ආකෘතිය අනුව පිළියෙළකර ගනු ලබන ඉල්ලුම්පත් පහත සඳහන් දිනට හෝ ඊට පෙර කොළඹ 2, තැ.පෙ. 560, විදේශීය හා දේශීය වෙළඳ අමාත්‍යාංශයේ ලේකම් වෙත ලැබෙන සේ එවිය යුතුය.

(ඒ) මෙරට ඉල්ලුම් පත්‍ර : 1973 මැයි මස 11 දින.

(බී) විදේශීය ඉල්ලුම් පත්‍ර : 1973 මැයි මස 18 දින.

**සටහන් :**

(i) ආදර්ශ ආකෘති පත්‍රය අනුව පිළියෙල කරනු නොලබන ඉල්ලුම් පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(ii) ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ හා සම්බන්ධිත ලිපියක් තැපැලේ දී නැතිවූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනය දක්වා ඉල්ලුම් පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභ හානි අයදුම්කරුවන් විසින්ම විඳ දරාගත යුතුය.

(iii) පිටරටවල අයදුම් කරුවන්ට තම ඉල්ලුම් පත්‍ර විදේශීය හා දේශීය වෙළඳ අමාත්‍යාංශයේ ලේකම් වෙත එවනු සඳහා, තමන් පදිංචි හෝ තමන්ට ආසන්නම හෝ රටට පත්කර සිටින ශ්‍රී ලංකා නියෝජිතයාගේ කාර්යාලයට නියමිත කාලසීමාව ඇතුළත දී භාරදීමට අයදුම්කරුට සිය අභිමතය පරිදි පිළිවන.

(iv) **වෛද්‍ය පරීක්ෂණය හා නැව් ගාස්තු.**—ශ්‍රී ලංකා ජනරජය යටතේ සේවය සඳහා පත් කරනු පිණිස විදේශයෙන් තෝරා ගනු ලබන ලාංකික නිලධාරීන් ඔවුන් සේවය සඳහා ශාරීරික වශයෙන් යෝග්‍ය දැයි දැනගනු පිණිස, පිළිගත් වෛද්‍ය වරයෙකු ඉදිරියෙහි පරීක්ෂණයක් සඳහා පෙනී සිටිය යුතුය. එම පරීක්ෂණය සඳහා ගාස්තුවත් ශ්‍රී ලංකාවට පැමිණීම සඳහා ඔවුන්ගේ නැව් ගාස්තුවත් ඔවුන් විසින්ම ගෙවිය යුතුවේ.

2. **සේවයෙහි නියුක්ත කරවීමේ වගන්ති හා කොන්දේසි.**—තනතුර ස්ථිරය. රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය. රජයේ සේවයෙහි දැනටමත් නියුක්ත ස්ථිර විශ්‍රාම වැටුප් සහිත තනතුරු දරණ අපේක්ෂකයකු තෝරාගනු ලැබුවහොත් තව දුරටත් එම විශ්‍රාම වැටුප් හිමිකම් ලැබෙනු ඇත.

3. **වැටුප් සහ දීමනා.**—මෙම තනතුරට හිමි ඒකාබද්ධ වාර්ෂික වැටුප් ක්‍රමය මෙසේ ය :—

රු. 6,720—360×12 හා 480×7—රු. 14,400. (රු. 7,800 හා රු. 11,520 ට ප්‍රථම කාර්යක්ෂමතා කඩ ඉම් ඇත.)

**සටහන.**—1969. 10. 01 වෙනි දිනට පෙර අනුරූප මූලික වාර්ෂික වැටුප් ක්‍රමය රු. 4,080—360×12 හා 480×6—රු. 11,280. (රුපියල් 5,160 හා රු. 8,860 ට ප්‍රථම කාර්යක්ෂමතා කඩඉම් ඇත.)

තෝරාගනු ලබන අපේක්ෂකයාගේ සුදුසුකම් හා පළපුරුද්ද අනුව ඔහු ඉහත සඳහන් වැටුප් ක්‍රමයේ සුදුසු වැටුප් තලයක තැබිය යුතු නම්, ආයතන අධ්‍යක්ෂගේ එකඟත්වය අනුව එම අනුග්‍රහය දිය හැකිය. දැනටමත් රාජ්‍ය සේවයේ නියුක්ත අපේක්ෂකයකු තෝරාගනු ලැබුවහොත්, ඔහුගේ වැටුප අංක 492 හා 59. 6. 13 දින දරන භාණ්ඩාගාර චක්‍රලේඛයෙන් සංශෝධිත අංක 361 හා 57. 2. 26 දිනැති භාණ්ඩාගාර චක්‍රලේඛයේ අඩංගු නීති රීති අනුව තීරණය කරනු ලබනවා ඇත.

4. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවකුම පහත සඳහන් කරුණු සනාථ කිරීමට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(අ) විශිෂ්ඨ චරිතයෙන් හා හොඳ ශාරීරික සනීපයෙන් යුක්ත බව ;

(ආ) 1973. 05. 11 දිනට වයස අවුරුදු 25 ට අඩු නොවිය යුතු අතර අවුරුදු 40 ට නොවැඩි විය යුතුය. දැනටමත් රාජ්‍ය සේවයෙහි නියුක්ත අපේක්ෂකයින් කෙරෙහි මෙම උපරිම වයස් සීමාව බලපාන්නේ නැත ;

(ඇ) ඉල්ලුම්කරුවෝ සිවිල් හා ක්‍රිමිනල් නීතිය පිළිබඳව 5 අවුරුද්දකට නොඅඩු පළපුරුද්දක් ඇති අධිනීතිඥයින් හෝ නීතිඥයින් විය යුතුය. ඔවුන්ට සමාගම් නීතිය සහ වෙළඳ ලකුණු හා මෝස්තර නීතිය පිළිබඳව ප්‍රායෝගික පළපුරුද්දක් සහ දැනුමක් තිබිය යුතුය. ව්‍යාපාර නාම, සමිති, සිට්ටු සහ ආරක්ෂක බලපත්‍ර නීතියද, ගණන් තැබීම හෝ පොත් තැබීමද පිළිබඳ ප්‍රායෝගික පළපුරුද්දක් හා දැනුමක් සහ සිංහල, දෙමළ පිළිබඳ සෑහෙන දැනුමක් ද අතිරේක සුදුසුකම් සේ සළකනු ලැබේ.

**සටහන.**—"අධිනීතිඥයින් හෝ නීතිඥයින් වන්නාවූ ද යටත් පිරිසෙයින් සමාගම් රෙජිස්ත්‍රාර් දෙපාර්තමේන්තුවේ අවුරුදු පහක සේවයක් ඇත්තා වූ සාමාන්‍ය ලිපිකාර සේවයේ අධි පන්තියේ හෝ I වැනි පංතියේ හෝ II වැනි පන්තියේ ද, ලඝු ලේඛක සේවයේ විශේෂ ශ්‍රේණියේ හෝ ඉහළ ශ්‍රේණියේ හෝ පහළ ශ්‍රේණියේ ද, යතුරු ලේඛක සේවයේ ඉහළ ශ්‍රේණියේ හෝ සාමාන්‍ය ශ්‍රේණියේ ද, උපාධිධාරී නොවන පරිවර්තක සේවයේ නිලධාරීන් හා සමාගම් රෙජිස්ත්‍රාර් දෙපාර්තමේන්තුවේ යටත් පිරිසෙයින් අවුරුදු පහක සේවයක් ඇති පරීක්ෂකයින් ඔවුන්ගේ නීති මඩුල්ලේ පළපුරුද්ද නොතකා පත් කිරීම සඳහා සලකා බලනු ලැබේ."

5. පහත සඳහන් ලියකියවිලි එකක් හෝ සියල්ලම අවශ්‍ය විටක ඉදිරිපත් කිරීමට සෑම අපේක්ෂකයෙකුම සූදානම් විය යුතුය :—

(ඒ) උප්පැන්න සහතිකය (සැ. යු.—අධ්‍යාපන රෙගුලාසි පරිදි උපකෘත පාසැලක ප්‍රයෝජනය සඳහා ඉදිරිපත් කරන ලද සහතික හෝ බෞතීස්ම සහතික භාරගනු නොලැබේ) ;

(බී) උපාධිය හෝ උසස්ම අධ්‍යාපනික සහතිකය ;

(සී) චරිත සහතික දෙකක්—මින් එකක් අධ්‍යාපන අධ්‍යක්ෂ තැනගෙන් හෝ විද්‍යාලයීය ආචාර්ය වරයෙකුගෙන් හෝ මහාචාර්යවරයාගෙන් විය යුතුය ;

(ඩී) වෘත්තීය සහ/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතික ;

(ඊ) සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් සමත් උසස්ම විභාගය පිළිබඳ සහතික.

සැ. යු. :—

(i) අයදුම්පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් හෝ නොඇමිණිය යුතුය.

(ii) ඉල්ලූ අවස්ථාවක ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකි අපේක්ෂකයින්ගේ අයදුම්පත් සලකා බලනු නොලැබේ.

6. රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් විසින් තම තමන්ගේ ඉල්ලුම් පත්‍ර ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය.

7. අයදුම්පත් හෝ ඒ සම්බන්ධ, අනෙකුත් ලියකියවිලි සියල්ලක්ම විදේශීය හා දේශීය වෙළඳ අමාත්‍යාංශයේ ලේකම් වෙත හැර කිසියම් නිලධාරියෙකුගේ නමට පුද්ගලිකව නොඑවිය යුතුය.

8. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (IIඅ) වන ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාල වන පොදු කොන්දේසි වලට අවධානය යොමු කරනු ලැබේ.

9. ඉල්ලුම්පත්‍ර මෙම කාර්යාලයට ලැබුණු බව අයදුම්කරුවන්ට දන්වනු ලැබේ. ඉල්ලුම්පත්‍ර භාරගන්නා අවසාන දිනයේ සිට සති තුනක් ඇතුළත, තම ඉල්ලුම්පත්‍රය ලැබුණු බවට දැන්වීමක් නොලැබෙන්නාවූ අයදුම්කරුවන් විසින් ඒ බව වහාම මා වෙත දැනුම් දිය යුතුය.

ජයන්ත කැලේගම,
විදේශීය හා දේශීය වෙළඳ අමාත්‍යාංශයේ ලේකම්.

1973 අප්‍රේල් මස 04 දින,
කොළඹ 2, යූනියන් පෙදෙස, අංක 330හි
විදේශීය හා දේශීය වෙළඳ අමාත්‍යාංශයේ දී ය.

**ආදර්ශ අයදුම් පත්‍රය**

(අයදුම් පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් නොඇමිණිය යුතුය)

සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව — සහකාර සමාගම් රෙජිස්ට්‍රාර් තනතුර

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරින්) :————.

2. තැපැල් ලිපිනය :————.
(ලිපිනයෙහි වෙනසක් වුවහොත් එය වහාම දැනුම් දිය යුතුය)

3. (අ) උපන් දිනය :—
වර්ෂය :————. මාසය :————. දිනය :————.
(ආ) දේශීය ඉල්ලුම්පත්‍ර භාරගන්නා අවසාන දිනය වන විට නියම වයස :————.
වර්ෂ :————. මාස :————. දින :————.

4. ඔබ ලංකා රටවැසියෙක් ද? පාරම්පරික රටවැසියෙක් ද? එසේ නැතහොත් ලියාපදිංචිවූ රටවැසියෙක් ද යන බව සඳහන් කරන්න. (ලියාපදිංචි වූ රටවැසියෙක් නම් සහතිකයේ යොමු අංකය හා දිනය සඳහන් කරන්න) :————.

5. උපන් ස්ථානය :—
(අ) අයදුම්කරුගේ :————.
(ආ) පියාගේ :————.
(ඇ) පිය පාර්ශ්වයේ මුත්තාගේ :————.
(ඇ) පිය පාර්ශ්වයේ මී මුත්තාගේ :————.
(ඉල්ලුම්කරු උපන්නේ ලංකාවේ නම් (අ) වලට අතිරේක වශයෙන් (ආ) හෝ (ඇ) සහ (ඇ) යන දෙකම හෝ පිරවිය යුතුය. ඔහු/ඇ උපන්නේ ලංකාවේ නොවේ නම් (අ) වලට අතිරේකව (ආ) සහ (ඇ) හෝ (ඇ) සහ (ඇ) හෝ පිරවිය යුතුයි.)

6. (අ) ස්ත්‍රී පුරුෂ භාවය :————.
(ආ) ඔබ විවාහක ද, අවිවාහක ද, වැන්දඹුවෙක් ද වැන්දඹුවක් ද යන බව :————.

7. සාමාර්ථය ලබා ඇති ඉහළම විභාගය :—
(i) සිංහල :————.
(ii) දෙමළ :————.
(iii) ඉංග්‍රීසි :————.

8. වයස අවු. 12 න් පසු ඉගෙනීම ලැබූ පාඨශාලාව, විද්‍යාල හා වෙනත් ආයතන :—

| සාමාන්‍ය අධ්‍යාපනය | | | වෘත්තීය අධ්‍යාපනය | | |
|---|---|---|---|---|---|
| පාඨශාලාව හෝ විද්‍යාලය | සිට | දක්වා | ආයතනය | සිට | දක්වා |
| 1. | | | 1. | | |
| 2. | | | 2. | | |

9. ක්‍රීඩා පිළිබඳව ලබා ඇති විශිෂ්ඨත්ව පිළිබඳ විස්තර සහ ඒ අංශයෙහි ඔබ විසින් උසුලන ලද වගකිවයුතු පදවි පිළිබඳ විස්තර :————.

10. ඔබ ණය ගැති භාවයෙන් මිදී සිටින්නේ ද? ණය ගැතිව සිටින්නේ නම් ඒ කොපමණකටද? :————.

11. ඔබ සාපරාධි වරදකට උසාවියකදී චෝදනා ලැබුවෙක් ද? එසේ නම් දිනයන් සහ නඩු අංකය සමග සම්පූර්ණ විස්තර සඳහන් කරන්න :————.

12. අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් :————.
(ලබාගන්නා ලද සියළුම උපාධි, විශිෂ්ඨ සාමාර්ථ, වෘත්තීය සුදුසුකම් වල විස්තර, ඒවායේ දින පන්තියක් වේ නම් එය, ඒවා සඳහා ගන්නා ලද විෂයයන් සහ ඒවා ලබාගත් ආයතන වල නම් සඳහන් කරන්න.)

13. දැනට නිරත රක්ෂාව හා ඊට ප්‍රථමයෙන් කරන ලද රක්ෂාවල් :—
(රක්ෂාවට බැඳුන දිනය ඉන් අස්වූ දිනය හා අන්තිමට ලැබූ වාර්ෂික වේතනය සඳහන් කරන්න.)

| පදවිය | සිට | දක්වා | වාර්ෂික වැටුප රුපියල් |
|---|---|---|---|
| 1. | | | |
| 2. | | | |
| 3. | | | |

**සැලකිය යුතුයි.**—ආණ්ඩුව යටතේ කළ සේවය අවසන් වීමට හේතුව මෙහි පහල 15 වෙනි කොටුවෙහි සඳහන් කළ යුතුය.

14. විශේෂ සුදුසුකම්.—(දන්වීමෙහි දක්වෙන විශේෂ සුදුසුකම් සහ/හෝ පළපුරුද්ද ඔබට ඇත්තේ ද? එසේ ඇතහොත් දිනයන්ද ඇතුළුව ඒ පිළිබඳ සම්පූර්ණ විස්තර සඳහන් කරන්න. විශේෂ සුදුසුකම් කිසිවක් නියම කොට ඇද්දැයි ගැසට් නිවේදනය බලන්න.)

15. තවත් තොරතුරු කිසිවක් වේ නම් ඒවා :————.

16. මෙම අයදුම් පතෙහි ම විසින් සපයන ලද තොරතුරු සත්‍ය වූත් නිවැරදිවූත් ඒවා බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරු වලින් කිසිවක් අසත්‍ය හෝ වැරදි බව මා තෝරා ගැනීමට පෙර දැනගතහොත් මා නුසුදුස්සකු වීමට යටත් බවත්, පත් කිරීමෙන් පසුව ඒ බව දැනගතහොත් මට කිසිදු වන්දියක් නොගෙවා මා සේවයෙන් පහ කිරීමට යටත් බවත් මම දැන සිටිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

අයදුම්කරු රාජ්‍ය සේවයේ නියුක්ත නම්, ඔහු පිළිබඳ දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.

දිනය :————.

4-516—73.04.19 දින අංක 56 දරණ ගැසට් පත්‍රය

---

අංකය : විඅා/2/243.

**අධ්‍යාපන අමාත්‍යාංශය**

**1973 ඉතාලි රජයේ ශිෂ්‍යත්ව**

ඉතාලි රජය විසින් 1973/74 අධ්‍යයන වර්ෂය සඳහා පිරිනමනු ලබන ශිෂ්‍යත්ව සඳහා අයදුම් පත් කැඳවනු ලැබේ.

මෙම ශිෂ්‍යත්ව පශ්චාත් උපාධි පාඨමාලා සඳහා වන්නේ ය.

ශිෂ්‍යත්වය සම්පූර්ණ කිරීමෙන් පසු ආපසු පැමිණ මෙරට ජීවනයට සැලකිය යුතු සේවයක් ඉටු කරනු ඇතැයි බලාපොරොත්තු විය හැකි ඔනෑ බුද්ධිමතුන් සඳහා මේ ශිෂ්‍යත්ව අදහස් කෙරේ.

**සංලක්ෂය 1 :** රජයේ සේවකයන්ගෙන් අයදුම්පත් භාරගනු ලබන්නේ, ශිෂ්‍යත්වයෙන් ලැබෙන පුහුණුව දෙපාර්තමේන්තුවේ යම් කිසි ව්‍යාපාරයක් සම්බන්ධයෙන් අවශ්‍ය බවට ඔහුගේ/ඇගේ දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් අංක 514 හා 1960.5.16 වැනි දින දරන භාණ්ඩාගාර චක්‍රලේඛය අනුව සහතික කරන්නේ නම් පමණය. එසේ කිරීමේදී, එම චක්‍ර ලේඛය යටතේ අවශ්‍ය විස්තරද දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් අයදුම්පත සමග ඉදිරිපත් කළ යුතුය.

**සංලක්ෂය 2 :** මණ්ඩල, සංස්ථා මණ්ඩල, විශ්ව විද්‍යාල හා රජයේ ආධාර හෝ අනුග්‍රහ ලබන වෙනත් එවැනි ආයතනවල සේවකයින්ගේ අයදුම්පත්, ඒ ඒ ආයතනවල ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතුයි. එවැනි අයදුම් පත් ඉදිරිපත් කිරීමේදී, අයදුම් පතේ 27 වැනි කොටුවේ සහතිකය ආයතන ප්‍රධානීන් ලවා නථා පරිදි සම්පූර්ණ කරවා එවිය යුතුය.

**සංලක්ෂය 3 :** එක් අයදුම්කරුවකු විසින් එවිය යුත්තේ එක් අයදුම් පතක් පමණය. ඉල්ලුම් කළ යුත්තේ ද එක් අධ්‍යයන පාඨමාලාවක් සඳහා පමණය.

**2. ශිෂ්‍යත්ව කාලය.**—ශිෂ්‍යත්ව කාලය සාමාන්‍යයෙන් එක් වර්ෂයක් වන්නේ ය.

එහෙත් අයථා හැසිරීම, අක්‍රමවත් පැමිණීම, බලධාරීන්ගේ අවසරය රහිතව විද්‍යාලයට හෝ ශිෂ්‍ය නිවාසයට නොපැමිණ සිටීම, ඉගෙනීමේ දියුණුවක් නොදැක්වීම හෝ විභාගවලින් සමත් විය නොහැකි වීම නිසා හෝ ඉතාලි බලධාරීන්ගේ අභිමතය පරිදි ශිෂ්‍යත්ව කාලය තුළ ඕනෑම අවස්ථාවක ශිෂ්‍යත්වය අවසන් කරනු ලැබීමට පුළුවන. එවැනි අවස්ථාවකදී ශිෂ්‍යත්වධාරියාට තමාගේම වියදමින් ශ්‍රී ලංකාවට ආපසු පැමිණීමට නියෝග කිරීමට ඉඩ ඇත්තේ ය.

**3. සුදුසුකම්.**—අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් ලබා සිටිය යුතුයි :—

(i) ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතුයි ;

(ii) 1973. 08. 01 වැනි දිනට, වයස අවුරුදු 35 ට අඩුවිය යුතුයි ;

(iii) ඉංග්‍රීසි භාෂාව පිළිබඳ උසස් ප්‍රවීණත්වයක් තිබිය යුතුයි ;

(iv) යටත් පිරිසෙයින් ඉගෙනීමට බලාපොරොත්තු පාඨමාලාවට උචිත, පිළිගත් විශ්ව විද්‍යාලයක දෙවන පෙළ උපාධියක් ලබා සිටිය යුතුයි.

**සංලක්‍ෂ්‍යය 1 :** ශ්‍රී ලංකා ජන රජය යටතේ හෝ මණ්ඩලයක, සංයුක්ත මණ්ඩලයක, විශ්ව විද්‍යාලයක හෝ ශ්‍රී ලංකා ජන රජයෙන් ආධාර හෝ අනුග්‍රහ ලබන වෙනත් එවැනි ආයතනයක නියමිත කාලයක් සේවය කිරීමට ඔප්පුවකින් හෝ ගිවිසුමකින් හෝ බැඳී සිටින අපේක්‍ෂකයන්, ඒ කාලසීමාවේ සේවය සම්පූර්ණ කොට 1973. 08. 01 දින වන විට ඔප්පුවෙන් හෝ ගිවිසුමෙන් සම්පූර්ණ වශයෙන් නිදහස් වී ඇත්නම් මිස, මේ ශිෂ්‍යත්ව සඳහා අයදුම් කිරීමට සුදුසු නොවන්නේ ය.

**සංලක්‍ෂ්‍යය 2 :** එසේම, තාවකාලික තනතුරු දරන හෝ ස්ථිර තනතුරු දරන නමුත් තනතුරේ ස්ථිර කරනු නොලැබූ රජයේ සේවකයන් ද, තෝරාගනු ලැබුවහොත් සේවයෙන් ඉල්ලා අස්වීමට කැමැති නම් මිස, අයදුම් කිරීමට සුදුසු නොවන්නේ ය. එසේ අස්වීමට කැමති නම්, ඒ බව අයදුම් පතේ 15 (ඊ) කොටුවේ නිශ්චිත වශයෙන් සඳහන් කළ යුතුය.

**4. ප්‍රදානයට අයත් ප්‍රතිලාභයන්.**—ශිෂ්‍යත්ව ප්‍රදානයට පහත සඳහන් ප්‍රතිලාභයන් ඇතුළත් ය :—

(අ) සංචාරක පන්තියේ ගුවන් මගින් ඉතාලියට යාම හා ආපසු ඒම ;

(ආ) ලීරා 80,000 ක මාසික දීමනාවකි ;

(ඉ) සමාජ සංරක්‍ෂණය ;

(ඊ) වෙනත් අනුමත කළ වියදම්.

**සංලක්‍ෂ්‍යය.**—මේ ශිෂ්‍යත්ව සඳහා තෝරාගනු ලබන රජයේ සේවකයන්ට නිවාඩු දීම, අවස්ථාවට වලංගුව පවත්නා භාණ්ඩාගාර හා දෙපාර්තමේන්තු නීති රීතීන්ට යටත් වන්නේ ය.

**5. සම්මුඛ පරීක්‍ෂණය.**—සුදුසුකම් ලත් අයදුම්කරුවන්, නියමිත ස්ථානයක හා නියමිත වේලාවක කොළඹදී පැවැත්වෙන සම්මුඛ පරීක්‍ෂණයකට පෙනී සිටිය යුතුය. මෙම සම්මුඛ පරීක්‍ෂණය සම්බන්ධයෙන් ගමන් හෝ වෙනත් වියදම් පිළිබඳ ගාස්තුවක් නොගෙවනු ලැබේ. සම්මුඛ පරීක්‍ෂණය සඳහා පැමිණෙන විට තමන්ගේ අධ්‍යාපනික සහතික, උප්පැන්න සහතිකය හා සුදුසුකම් පිළිබඳ වෙනත් ලියවිලිවල මුල් පිටපත් රැගෙන ඒමට සූදානම් වී සිටිය යුතුය.

**6. ගිවිසුම.**—තෝරාගනු ලබන අපේක්‍ෂකයන් ඉතාලිය බලා පිටත්ව යාමට පෙර—

(අ) අනෙකුත් කරුණු අතර, නියමිත අධ්‍යයන පාඨමාලාව අවංකව හා අනලස්ව හදාරා සතුටුදායක ලෙස එය සම්පූර්ණ කිරීමට හා ශිෂ්‍යත්වය සම්පූර්ණ කිරීමෙන් පසු අවශ්‍ය වුවහොත්, ශ්‍රී ලංකා ජන රජය විසින් නියම කරනු ලබන යම්කිසි කාලසීමාවක් තුළ ශ්‍රී ලංකා ජන රජය යටතේ සේවය කිරීමට ද ;

(ආ) තමාගේ ගිවිසුමේ සඳහන් කොන්දේසි හා නියමයන්ට අනුකූලව ක්‍රියා කිරීමට නොහැකි වන අවස්ථාවකදී, ශිෂ්‍යත්වයේ සම්පූර්ණ වටිනාකම (එනම්, සම්පූර්ණ ශිෂ්‍යත්වය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ජන රජයට හා ප්‍රදාන අධිකාරීන්ට දරන්නට සිදුවූ සියළුම වියදම් හා රජයේ සේවකයෙක් නම්, ඊට අමතරව වේතනය, දීමනා ආදිය ඇතුළු වියදම්) ශ්‍රී ලංකා ජන රජයට ආපසු ගෙවීමට ද, පොරොන්දුවන ගිවිසුමකට අත්සන් කළ යුතුය.

**7. වෛද්‍ය පරීක්‍ෂණය.**—තෝරාගනු ලබන අපේක්‍ෂකයන් ඉතාලියේ අධ්‍යනය පාඨමාලාවක් අනුගමනය කිරීමට සුදුසු ශාරීරික හා මානසික යෝග්‍යතාවක් ඇති බවට ද ශ්‍රී ලංකා ජන රජය විසින් පත් කරනු ලබන විශේෂ වෛද්‍ය මණ්ඩලයක් මගින් පැවැත්වෙන වෛද්‍ය පරීක්‍ෂණයකින් සමත් විය යුතුය.

8. රජයේ සේවකයන් සම්බන්ධයෙන්, බලාපොරොත්තු වන පුහුණුව ඔවුන් විසින් දැනට දරන තනතුරෙහි වැඩි වේතනයක් හෝ උසස්වීමක් ලැබීමට සුදුසුකමක් නොවන්නේ ය. සෙසු අය සම්බන්ධයෙන් ශිෂ්‍යත්වය සම්පූර්ණකොට ආපසු පැමිණීමෙන් පසු රක්‍ෂා ලබා දීමට ශ්‍රී ලංකා ජන රජය පොරොන්දු නොවන්නේ ය.

9. මෙම ඉල්ලුම් පත්‍රයෙහි යම්කිසි වැරදි ප්‍රකාශයක් කර ඇති බව තෝරාගැනීමට කලින් අනාවරණය වුවහොත් අයදුම්කරු එයින් නුසුදුසු බවට පත්වේ. තෝරාගැනීමෙන් පසුව ඒ බව අනාවරණය වුවහොත් ප්‍රදානය අවලංගු කරනු ලැබේ.

10. තෝරාගනු ලැබූ අපේක්‍ෂකයෙකු තෝරාගැනීමෙන් පසු නාම යෝජනා කරනු ලැබීම හෝ නාම යෝජනා කිරීමෙන් පසු ප්‍රදානයක් පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කළහොත්, අවුරුදු දෙකක කාල පරිච්ඡේදයක් ගතවන තුරු, අන් කවර ශිෂ්‍යත්ව ප්‍රදානයක් සඳහා හෝ ඔහු සලකා බලනු නොලැබේ.

11. කිසියම් අපේක්‍ෂකයකු ශ්‍රී ලංකා අධිකාරීන් විසින් නාම යෝජනා කරනු ලැබීම, ශිෂ්‍යත්ව ප්‍රදානය සඳහා තමා පිළිගනු ලැබීමක් ලෙස නොසිතිය යුතු බව පැහැදිලිව අවබෝධ කටයුතුය. ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම, සම්පූර්ණයෙන්ම, නාම යෝජනා ඉදිරිපත් කරනු ලබන ප්‍රධාන අධිකාරීන්ගේ අභිමතය පරිදිම සිදුවන්නක් හෙයිනි.

12. යම් අපේක්‍ෂකයකු තෝරා ගැනීම සම්බන්ධයෙන් කවර අන්දමකින් හෝ අයථා අනුග්‍රහයක් ලබාගැනීමට හෝ බලපෑවැත්වීමකට හෝ උත්සාහයක් දරණු ලැබුව හොත්, ඒ හේතුවෙන්ම එම අපේක්‍ෂකයා නුසුදුසු බවට පත් වන්නේ ය.

13. මේ නිවේදනයේ හා අයදුම්පත් ආකෘතියේ සඳහන් අවශ්‍යතාවන් සියල්ල සෑම ආකාරයෙන් සම්පූර්ණ නොකෙරෙන අයදුම්පත් ප්‍රතික්‍ෂෙප කරනු ලබන්නේ ය.

14. මේ කාර්යාලයෙන් ලබා ගත යුතු විශේෂ ආකෘතියක පිළියෙල කළ යුතු අයදුම් පත්, 1973. 5. 4 වැනි දින හෝ ඉන් පෙර ලැබෙන සේ, කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් වෙත එවිය යුතුය. ප්‍රමාද වී ලැබෙන අයදුම් පත් භාර ගනු නොලැබේ.

15. සෑම අයදුම් පතක් සම්බන්ධයෙන්ම රුපියල් 10ක මුද්දර ගාස්තුවක් ගෙවිය යුතු වන්නේ ය. අයදුම් පත් ආකෘතියේ මුල් පිටුවේ ඒ සඳහා වෙන්කොට ඇති කොටුවේ රුපියල් 10ක මුද්දර අලවා ඒ මත අයදුම්කරුගේ අත්සන යෙදීමෙන් අවලංගු කළ යුතුය.

16. රජයේ සේවකයින් විසින් එවන අයදුම් පත් සිය දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් ද, මණ්ඩල, සංයුක්ත මණ්ඩල, විශ්ව විද්‍යාල හා රජයේ ආධාර හෝ අනුග්‍රහ ලබන වෙනත් එවැනි ආයතනවල සේවකයන් විසින් එවන අයදුම් පත් ඒ ඒ ආයතන ප්‍රධානීන් මගින් ද එවිය යුතුයි. සේවයෙන් ඉල්ලා අස්වීමට සූදානම් වුවද, මේ අවශ්‍යතාව සරපුාලිය යුතුය. අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ සේවය කරන නිලධාරීන් අදාල අධ්‍යාපන අධ්‍යක්‍ෂවරුන් මාර්ගයෙන් තම අයදුම් පත් ඉදිරිපත් කළ යුතුය.

17. සියළුම අයදුම් පත් ලැබුණු බව දන්වනු ලැබේ. අයදුම් පත් භාරගනු ලබන අවසාන දින සිට දින 7 ක් ඇතුළත අයදුම් පත් ලැබුණු බවට දැන්වීමක් නොලද හොත්, ඒ බව අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් වෙත වහාම දැනුම් දිය යුතුය. එසේ නොකිරීමේ හේතුවෙන් අයදුම්කරු ගැන සලකා බැලීමට ඇති අයිතිවාසිකම් ඔහුට අහිමි වන්නේ ය.

අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්.

1973 අප්‍රේල් මස 10 වැනිදා,
කොළඹ 2, මැලේ වීදියේ
අධ්‍යාපන අමාත්‍යාංශයේ දී ය.

4-519—73.04.19 දින අංක 56 දරණ ගැසට් පත්‍රය

යොමු අංකය : සාප/20/240.

**අධ්‍යාපන අමාත්‍යාංශය**

ශ්‍රව්‍ය දෘශ්‍ය අංශයේ කණිෂ්ඨ කාර්මික සහකාර තනතුර

අධ්‍යාපන අමාත්‍යාංශයේ ශ්‍රව්‍ය දෘශ්‍ය අංශයේ කණිෂ්ඨ කාර්මික සහකාර තනතුර සඳහා පහත දැක්වෙන සුදුසුකම් ඇති අපේක්ෂකයන්ගෙන් ඉල්ලුම් පත්‍ර කැඳවනු ලැබේ. මෙහි පහත දක්වා ඇති ආදර්ශ ආකෘතිය අනුව පිළියෙල කරන ලද ඉල්ලුම් පත්‍ර 1973.05.05 වැනි දින හෝ ඊට පෙර කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන අමාත්‍යාංශයේ (සාමාන්‍ය පරිපාලන ශාඛාවේ) ලේකම් නැත වෙත ලැබෙන සේ එවිය යුතුයි.

2. **සේවයේ නියුක්ත කරවීමේ වගන්ති හා කොන්දේසි.**—(i) තනතුර ස්ථිරය. තෝරාගනු ලබන අපේක්ෂකයින් දනටමත් විශ්‍රාම වැටුප් සහිත රජයේ තනතුරක් නොදරයි නම්, රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදලට දායකයන් වනු ඇත. තෝරා ගනු ලබන අපේක්ෂකයින්, පත්වීම ලබන දින රාජ්‍ය සේවයේ හෝ පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු දරන්නේ නම්, තවදුරටත් එම විශ්‍රාම වැටුප් අයිතිය භුක්ති විඳිනු ඇත. තෝරාගනු ලබන අපේක්ෂකයින්, දැනටමත් රජයේ සේවයෙහි නියුක්ත නැතිනම්, මුල් වතාවේ, තුන් අවුරුදු පරිවාස කාලයක් මත පත් කෙරෙනු ඇත. රාජ්‍ය සේවයෙහි නියැලි ස්ථිර සහ විශ්‍රාම වැටුප් සහිත නිලධාරියකු තෝරා ගනු ලැබුවහොත් ඔහුගේ/ඇයගේ පත්වීම එක් අවුරුදු කාල පරිච්ඡේදයක වැඩ බැලීමේ පදනමක් මත වනු ඇත.

(ii) තෝරාගනු ලබන අපේක්ෂකයා විසින් පහත සඳහන් අයුරු රු. 5,000 ක් ඇප තැබිය යුතුවේ. මුදලින් රු. 2,000 ක් ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ තැන්පත් කළ යුතුවේ. එම මුදල තැන්පත් කළ යුත්තේ පත්වීම ලබන අවස්ථාවේ දී රු. 200 ක් හා මාස් පතා රු. 10 කොටස් වශයෙනි. මීට අමතරව රු. 3000ක් වටිනා බැඳුම්කරයකට අත්සන් කළයුතුය.

3. **වැටුප් හා දීමනා.**—වර්ෂයකට රු. 3,864—18 × 144—රු. 6,456 ක ඒකාබද්ධ වැටුප් ක්‍රමය හිමි වේ. රු. 5,304 ඒකාබද්ධ වාර්ෂික වැටුප් වැඩිවීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි.

**සටහන.**—1969. 10. 1 දිනට පෙර පැවති මීට අනුරූප වැටුප් ක්‍රමය, වර්ෂයකට රු. 1,620—120—රු. 3,780 වේ. කාර්යක්ෂමතා කඩඉම් වාර්ෂික රු. 2,820 වැටුපට පෙර.

4. **අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්.**—(i) ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 21ට නො අඩු හා 35ට නො වැඩි විය යුතුය. (දැනටමත් රජයේ සේවයේ යෙදී සිටින්නන්ට උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.)

(ii) විශිෂ්ඨ චරිතයෙන් හා හොඳ ශාරීරික සනීපයෙන් යුක්ත විය යුතුය.

(iii) දෙවරකට නොවැඩි වාර ගණනකදී රසායනික විද්‍යාව, භෞතික විද්‍යාව, ගණිතය (ශුද්ධ හෝ ව්‍යවහාරික) ඇතුළු විෂයයන් 6කින් පොදු අධ්‍යයන සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයෙන් හෝ රසායන විද්‍යාව, භෞතික විද්‍යාව, ගණිතය (ශුද්ධ හෝ ව්‍යවහාරික) සහිත ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට උසස් විභාගයකින් සමත් විය යුතුයි.

(iv) ගුවන් විදුලි යන්ත්‍ර, ශබ්ද විකාශන යන්ත්‍ර, පටිගත කිරීමේ යන්ත්‍ර, තැටි වාදන යන්ත්‍ර හා ශබ්ද කැවූ චිත්‍රපට ප්‍රක්ෂේපක යන්ත්‍ර ක්‍රියා කරවීම, නඩත්තුව හා අළුත්වැඩියා කිරීම පිළිබඳව යටත් පිරිසෙයින් තුන් අවුරුදු පළපුරුද්දක් තිබිය යුතුයි.

(v) විදුලි ඉලෙක්ට්‍රොනික් උපකරණ අළුත්වැඩියා කිරීමේ දී පාවිච්චි කරණ නානා වර්ගයේ පරීක්ෂණ උපකරණ පාවිච්චි කිරීමේ මනා දැනීමක් තිබිය යුතුයි.

**අතිරේක සුදුසුකම්.**—

(i) ලෝහ වැඩ පිළිබඳ ප්‍රායෝගික පළපුරුද්ද ;

(ii) නොයෙක් ආකාරයෙන් යුත් ඡායාරූප කැමරා භාවිතය, ලියකියවිලි පිටපත් කිරීම හා ඡායාරූප විශාල කිරීම හා සම්බන්ධ අඳුරු කාමර ක්‍රියා මාර්ගය පිළිබඳ පළපුරුද්ද ;

(iii) චිත්‍රපට නඩත්තු කිරීම, ගබඩා කිරීම හා බෙදා හැරීම පිළිබඳ දැනුම හා පළපුරුද්ද ;

(iv) අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ඇති කාර්මික අධ්‍යාපන ආයතනයක ගුවන් විදුලි යන්ත්‍ර සේවා කිරීම පිළිබඳ සහතිකයක් ලබා තිබීම ;

ආදී අතිරේක සුදුසුකම් ලබා තිබෙන අයදුම්කරුවන් ගැන විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.

5. පහත සඳහන් ලියකියවිලි එකක් හෝ සියල්ලම අවශ්‍යවූ විටක ඉදිරිපත් කිරීමට සෑම අයදුම්කරුවකුම සූදානම් විය යුතුය :—

(අ) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකය හෝ අධ්‍යයන පොදු සහතිකය ;
(ආ) 4 (iv) සහ (v) ඡේදයේ සඳහන් සහතික පත්‍ර ;
(ඇ) සිංහලෙන් සමත් වී ඇති ඉහළම විභාගය දැක්වෙන සහතිකය ;
(ඈ) උප්පැන්න සහතිකය.

**සටහන.**—

(i) ලියකියවිලිවත්, ලියකියවිලිවල පිටපත්වත් අයදුම්පතට අමුණා නො එවිය යුතුයි.

(ii) ලියකියවිලි ඉදිරිපත් කරන ලෙස නියම කරනු ලැබූ විට ඒවා ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අයදුම්කරුවන්ගේ ඉල්ලුම්පත් ගැන සලකා බලනු නො ලැබේ.

6. අයදුම්කරුවන් විසින් තම තමන්ගේ ඉල්ලුම් පත් ස්වකීය දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතුය. නියමිත දිනට ප්‍රමාද වී ලැබෙන ඉල්ලුම් පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. එහෙත් නියම අවස්ථාවේදී දෙපාතමේන්තු/ආයතන ප්‍රධානියාට ලැබී ප්‍රමාදය සඳහා සැළකිය යුතු කාරණයක් ඉදිරිපත් කළහොත් පමණක් එසේ ප්‍රමාද වී ලැබෙන ඉල්ලුම් පත් බාර ගනු ලැබේ.

7. මෙම ගැසට් පත්‍රයේ I කොටසේ (II) (අ) ඡේදයේ ආරම්භයේ දැක්වෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරනු ලබන පත්වීම් සම්බන්ධ පොදු කොන්දේසි බලනු මැනවි.

8 ඉල්ලුම් පත් ලැබුන බව දන්වනු ලැබේ. ඉල්ලුම් පත් බාරගන්නා අවසාන දිනය පසුවී දින 21ක් ඇතුළත ඉල්ලුම්පත් ලැබුණ බවට ලිපියක් නොලදහොත් වහාම ඒ බව අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් වෙත දැන්විය යුතුය. කිසියම් අයදුම්කරුවෙකු මේ අවශ්‍යතාවය පැහැර හරින්නේ නම් තම අයදුම් පත්‍රය සළකා බලනු වස් ඉල්ලා සිටීමේ අයිතිය ඔහුට අහිමි වනු ඇත.

ප්‍රේමදාස උඩගම,
අධ්‍යපන අමාත්‍යාංශයේ ලේකම්.

1973. 04. 19,
කොළඹ 2, මැලේ වීදියේ,
අධ්‍යාපන අමාත්‍යාංශයේ,
සාමාන්‍ය පරිපාලන ශාඛාවේදී ය.

යොමුව : සාප/20/240.

**ඉල්ලුම් පත්‍රයේ ආදර්ශ ආකෘතිය**

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්) :————.

2. ස්ථිර ලිපිනය :————.

3. ගම් ප්‍රදේශය :————.

4. අයදුම් පත් භාර ගන්නා අවසාන දිනට නියම වයස :————.
උපන් දිනය :————.

5. උපන් ස්ථානය :—
(අ) ඉල්ලුම්කරු :————.
(ආ) ඉල්ලුම්කරුගේ පියා :————.
(ඇ) ඉල්ලුම්කරුගේ පියාගේ පියා :————.
(ඈ) ඉල්ලුම්කරුගේ පියාගේ පියාගේ පියා :————.

6. ලාංකිකත්වය පරම්පරාවෙන්ද, ලියාපදිංචි කිරීමෙන්ද යන වග :————.

7. අධ්‍යාපන සුදුසුකම් :—
(i) සාමාන්‍ය :————.
(ii) වෘත්තීය හා/හෝ කාර්මික සහතිකවල විස්තර : ————.
(iii) සිංහලෙන්/දෙමළෙන් සමත් වී උසස්ම විභාගයේ විස්තර :————.

8. නිවේදනයේ 4 වැනි ඡේදයේ (iv) සහ (v) අනුඡේද යටතේ සේවා විස්තර (සේවය කළ ආයතන, සේවා කාලයන්, දැරූ තනතුරු සඳහන් කළ යුතුයි) :————.

| තනතුර | සේවයකළ ආයතනය | සේවා කාලය | | අස්වීමට හේතුව |
|---|---|---|---|---|
| | | සිට | දක්වා | |
| | | | | |

9. විවාහකද, අවිවාහකද, වැන්දඹුද ? :————.

10. කිසියම් අපරාධ වරදක් නිසා අධිකරණය මගින් වරදකරු කරනු ලැබුවේද ? එසේනම් :
(අ) දිනය :————.
(ආ) නඩු නොම්මරය :————.
(ඇ) වරදෙහි ස්වභාවය සඳහන් කරන්න :————.

11. මුදල් කරදරවලින් නිදහස් ද? එසේ නොවේනම්, ඔබේ ණය තුරුස්වල ප්‍රමාණය කොපමණද? :————.

12. ඔබට විරුද්ධව විනයානුකූලව කටයුතු කර තිබේද? එසේ නම් ඒ පිළිබඳ විස්තර :————.

13. සේවාමුක්ත භටයෙක් වී නම් (අ) සේනාංකය (ආ) නිලය (ඇ) සේවයට බැඳුණු හා නිදහස් කරන ලද දින පිළිබඳ විස්තරය :————.

14. පාඨශාලාවෙන් අස්වූ දින සිට යෙදී සිටි රැකීරක්ෂා :—

(i) දරන ලද තනතුර :————.

(ii) නියුක්තව සිටි වකවානුව :————.

(iii) අස්වීමට හේතුව :————.

15. ආණ්ඩුව යටතේ හෝ පළාත් පාලන ආයතනයන් යටතේ හෝ කලින් ස්ථිර හෝ තාවකාලික වශයෙන් රක්ෂාවෙහි යෙදී සිට, එම සේවය යම් අවස්ථාවකදී නතර කරන ලද්දේ නම් :—

(අ) එම රක්ෂාව පිළිබඳ විස්තර :————.
(ආ) සේවයේ යෙදී සිටි කාලය :————.
(ඇ) සේවය නතර කිරීමට හේතු :————.

16. දැනට යෙදී සිටින රක්ෂාව :—

(i) ආයතනයේ නම :————.

(ii) තනතුරු හා ශ්‍රේණිය :————.

(iii) ඊට පත්වූ දිනය :————.

(iv) විශ්‍රාම වැටුප් සහිත ද තාවකාලික හෝ අනියම් ද? ————.

(v) දීමනා රහිතව දැනට ලැබෙන වැටුප හා වැටුප් ක්‍රමය :————.

(vi) මීළඟ වැටුප් වැඩිවීමේ දිනය :————.

17. වෙනත් කරුණු :————.

මේ අයදුම් පතෙහි මා විසින් සඳහන් කරන ලද විස්තර සත්‍ය බවත්, නිවැරදි බවත්, මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කිසියම් කරුණක් අසත්‍ය හෝ වැරදි බැව් තෝරාගනු ලැබීමට පළමු සොයා ගනු ලැබුවහොත් මා නුසුදුස්සකු බවට පත්වන බවත්, පත් කිරීමෙන් පසු වරද අනාවරණය වුවහොත්, වන්දියක් නොමැතිව මා සේවයෙන් පහකළ හැකි බවත් මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

**දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ සහතිකය**

මගේ අංකය :
ඔබේ අංකය : සාප/20/240.

අධ්‍යා./ලේ.,

මෙම අයදුම් පත මෙම කාර්යාලයට ලැබී ඇත්තේ අයදුම් පත භාරගන්නා අවසාන දිනට පසුය/පෙරය*

ඉල්ලුම් පත්‍රයේ ............................ අංකිත ඡේදවල විස්තර නිවැරදි බැව්/පහත සඳහන් සංශෝධනයන්ට යටත්* බැව් මෙයින් සහතික කොට ඉදිරිපත් කරමි.

.................................
දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ අත්සන.

පදවි නාමය : ..............................

දිනය :...............................
*අදාල නැති කොටස් කපා හරින්න.

4–545—73.04.19 දින අංක 56 දරණ ගැසට් පත්‍රය

---

**ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ කොඩ්ඩියාර් නැගෙනහිර කොට්ඨාශයේ උප්පැන්න හා මරණ සහ කොඩ්ඩියාර් පත්තු කොට්ඨාශයේ විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය**

කොඩ්ඩියාර් නැගෙනහිර උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාශය තුළ ස්ථිර පදිංචියක් ඇත්තාවූ හෝ එහි කාලයක් පදිංචිව සිටීම හේතුකොට ගෙන ගම්වාසීන්ගෙන් සැලකුම් ලබන, ඉල්ලුම් පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු විසි එකට නොඅඩු ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයෙන්ම ඉහත සඳහන් ධුරය සඳහා ඉල්ලුම් පත් කැඳවනු ලැබේ. රජයේ සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා මෙම වයස් සීමාව අදාල නොවේ.

2. මෙම ධුරය සඳහා ඉදිරිපත්වන අයට තිබිය යුතු අධ්‍යාපනික හා හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ සියලු විස්තර මෙම කාර්යාලයේ සහ ප්‍රාදේශීය ආදායම් පාලක නිලධාරි කාර්යාලය, ග්‍රාම සේවක කාර්යාලය, පළාත් පාලන ආයතන කාර්යාල, ග්‍රාමීය උසාවි, තැපැල් කාර්යාල, පොලිස් ස්ථාන සහ ප්‍රජාමණ්ඩල, ප්‍රසිද්ධ වෙළඳ පොලවල් සහ සමුපකාර සමිති ආදි කොට්ඨාශයේ ප්‍රසිද්ධ ස්ථාන සහ කාර්යාලවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වල ඇතුළත් වේ.

3. සියලුම ඉල්ලුම් පත් මෙම කාර්යාලයෙන් ලබාගත හැකි ආකෘති පත්‍රවල සකස්විය යුතු අතර, ඒවා 1973 නෝ මැයි මස 24 වෙනි දිනට හෝ ඊට පෙර මා වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය.

තිස්ස දේවේන්ද්‍ර,
දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්.

1973 අප්‍රේල් මස 9 දින,
ත්‍රිකුණාමලේ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේදිය.

4–578—73.04.19 දින අංක 56 දරණ ගැසට් පත්‍රය

---

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය—ප්‍රායෝගික සිංහල/දෙමළ

ප්‍රායෝගික සිංහල සහ ප්‍රායෝගික දෙමළ යන විෂයයන් අ. පො. ස. (සාමාන්‍ය පෙළ) විභාගයේ අනුමත විෂය මාලාවෙන් ඉවත් කර ඇති බව සියළුම පාඨශාලා ප්‍රධානීන් සහ අයදුම්කරුවන් වෙත දන්වමි. මෙම විෂයයන් වෙනුවට 1973 විභාගයේ සිට අළුතින් සකස් කරන ලද නිර්දේශ යටතේ ක්‍රියාත්මක වන වෛකල්පික සිංහල හෝ වෛකල්පික දෙමළ යන විෂයයන්ට පෙනී සිටීමට පුළුවන. මෙම නව නිර්දේශයන් ගැසට් පත්‍රයේ මාර්ගයෙන් ප්‍රසිද්ධ කරනු ලබන අතර, කලින් පැවති මෙම විෂයයන්ගේ නිර්දේශයනට වඩා වෙනස් වනුයේ සුළු වශයෙනි.

බෝගොඩ ප්‍රේමරත්න,
විභාග කොමසාරිස්.

1973 අප්‍රේල් මස 5 දින,
කොළඹ 2,
විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

4–542—73.04.19 දින අංක 56 දරණ ගැසට් පත්‍රය

අංකය : 1/83/30 (ජී).

**රජයේ ලඝුලේඛක සේවයේ පහළ ශ්‍රෙණියේ නිලධාරීන් සඳහා වූ II වැනි කාර්යක්ෂමතා කඩඉම් (ඉංග්‍රීසි) විභාගය 1972 නොවැම්බර් 18**

අංක 134 (ජී) හා 1966 ඔක්තෝබර් 23 වැනි දිනැති භාණ්ඩාගාර චක්‍රලේඛ ලිපියේ සහ අංක 170 (ජී) හා 1967 පෙබරවාරි 7 වැනි දින දරණ භාණ්ඩාගාර චක්‍රලේඛ ලිපියේ දැක්වෙන පරිපාටියේ ප්‍රකාර 1972 නොවැම්බර් 18 දින පවත්වන ලද රජයේ ලඝු ලේඛක සේවයේ පහළ ශ්‍රෙණියට අයත් ලඝු ලේඛකයින්ගේ වාර්ෂික ඒකාබද්ධ වැටුප රු. 5,736 ක් වීමට පෙර ඇති II වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයේදී පහත නම් සඳහන් ලඝු ලේඛකයින් ඔවුන්ගේ නම් ඉදිරියෙන් සඳහන් විෂයයෙන් සමත් වී ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ: —

| නම | දෙපාර්තමේන්තුව | විෂයය |
|---|---|---|
| කරුණාසේන, වී. ... | දිස්ත්‍රික් උසාවිය, බලපිටිය ... | ලඝුලේඛනය සහ යතුරු ලියනය |
| ෂන්මුගනාදන්, වී. ... | පොලිස් කාර්යාලය, මඩකලපුව | එම |

2. සම්මේලන වාර්තා කිරීමේ පරීක්ෂණයට ඇතුළත් කර ගැනීමට සුදුසුකම් ලබා ඇති ඉහත නම් සඳහන් අපේක්ෂකයින්ද මීට පෙර සුදුසුකම් ලබා ඇති නිලධාරීන්ද මීළඟ සම්මේලන වාර්තා කිරීමේ පරීක්ෂණයට ඇතුලුකර ගැනීම සඳහා තමන් සේවය කරන දෙපාර්තමේන්තු ප්‍රධානීන් ගේ මාර්ගයෙන් විභාග කොමසාරිස් වෙත ලියා පදිංචි කළ තැපෑලෙන් යැවෙන ලිපියකින් වහාම ඉල්ලා සිටිය යුතුය.

ආර්. එම්. බී. සේනානායක,
රාජ්‍ය පරිපාලන අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට.

1973 අප්‍රේල් මස 10 වැනි දින,
කොළඹ 7, ටොරින්ටන් චතුරශ්‍රයේ,
රාජ්‍ය පරිපාලන දෙපාර්තමේන්තුවේ
ඒකාබද්ධ සේවා අංශයේ දී ය.

4–556/1—73.04.19 දින අංක 56 දරණ ගැසට් පත්‍රය

---

මගේ අංකය : 1/83/30 (ජී).

**රජයේ ලඝු ලේඛක සේවයේ පහළ ශ්‍රෙණියේ නිලධාරීන් සඳහා වූ I වැනි සහ II වැනි කාර්යක්ෂමතා කඩඉම් (සිංහල/දෙමළ) විභාගය—1972 නොවැම්බර්**

1972 නොවැම්බර් මස 18 වෙනි දින පවත්වන ලද යථෝක්ත විභාගවලින් කිසිවෙකු සමත් වී නොමැති බව මෙයින් දන්වමි.

ආර්. එම්. බී. සේනානායක,
රාජ්‍ය පරිපාලන අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට.

1973 අප්‍රේල් මස 10 දින,
කොළඹ 7, ටොරින්ටන් චතුරශ්‍රයේ,
රාජ්‍ය පරිපාලන දෙපාර්තමේන්තුවේ
ඒකාබද්ධ සේවා අංශයේ දීය.

4–556/2—73.04.19 දින අංක 56 දරණ ගැසට් පත්‍රය

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළකරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපැලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළකළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුළත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවටද හේතු වන බව සලකන්න.

ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දයක මුදල් භාර නොගනී. සියළුම දයක මුදල් කොළඹ මහාලේකම් කාර්යාල හොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙළින්ම ගෙවිය යුතුය.

**සැ.යු.**—මුදල් ගෙවා ගැසට් පතෙහි පළකරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශනාංශයේ අධිකාරී වෙත නොව ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සලකන්න.

### උපලේඛනය
1973

| මාසය | පළකිරීමේ දිනය | ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | |
|---|---|---|---|
| අප්‍රේල් ... | 73.04.06 සිකුරාද ... | 73.03.28 බදාද | දවල් 12.00 |
| | 73.04.11 බදාද ... | 73.04.04 බදාද | දවල් 12.00 |
| | 73.04.19 බ්‍රහස්පතින්ද ... | 73.04.11 බදාද | දවල් 12.00 |
| | 73.04.27 සිකුරාද ... | 73.04.18 බදාද | දවල් 12.00 |
| මැයි ... | 73.05.04 සිකුරාද ... | 73.04.25 බදාද | දවල් 12.00 |
| | 73.05.11 සිකුරාද ... | 73.05.02 බදාද | දවල් 12.00 |
| | 73.05.18 සිකුරාද ... | 73.05.09 බදාද | දවල් 12.00 |
| | 73.05.25 සිකුරාද ... | 73.05.15 අඟහරුවාද | දවල් 12.00 |
| ජූනි .. | 73.06.01 සිකුරාද ... | 73.05.23 බදාද | දවල් 12.00 |
| | 73.06.08 සිකුරාද ... | 73.05.30 බදාද | දවල් 12.00 |
| | 73.06.14 බ්‍රහස්පතින්ද ... | 73.06.06 බදාද | දවල් 12.00 |
| | 73.06.22 සිකුරාද ... | 73.06.13 බදාද | දවල් 12.00 |
| | 73.06.29 සිකුරාද ... | 73.06.20 බදාද | දවල් 12.00 |

**එල්. ඩබ්ලිව්. පී. පීරිස්.**
**ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති**

**1972 ඔක්තෝබර් මස 20 වැනි දින.**

**ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, කොළඹ.**

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රිතයි.